
සෞඛ්‍ය අමාත්‍යංශය
ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්
சுகாதார அமைச்சு
இலங்கை திரிபோஷ கம்பனி

# Ministry of Health
# Sri Lanka Thriposha Ltd.

ත්‍රිපෝෂ
THRIPOSHA
திரிபோஷ




# වාර්ෂික වාර්තාව
# ஆண்ட றிக்கை
# Annual Report

# 2017

# ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්
# වාර්ෂික වාර්තාව - 2017

**පෙළගැස්ම** **පිටුව**


| | | |
|---|---|---|
| 1. | අපගේ දැක්ම/ මෙහෙවර | 01 - 02 |
| 2. | ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ සභාපතිතුමාගේ පණිවිඩය | 03 - 04 |
| 3. | ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ අධ්‍යක්‍ෂ මණ්ඩලය | 05 |
| 4. | ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම කෙටියෙන් හදුනා ගනිමු | 06 |
| 5. | ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ විගණන හා කළමනාකරන කමිටුව සහ ප්‍රසම්පාදන කමිටු | 07 |
| 6. | ත්‍රිපෝෂ ආයතනයේ ඉතිහාසය හා වර්තමාන ප්‍රගතිය | 08 - 09 |
| 7. | මානව සම්පත් විශ්ලේෂණය | 10 - 11 |
| 8. | සැපයුම්කරුවන් පිළිබද විස්තර | 12 |
| 9. | නිෂ්පාදන තොරතුරු හා අපේක්‍ෂිත ඉලක්කය | 13 - 16 |
| 10. | ත්‍රිපෝෂ බෙදාහැරීමේ ක්‍රියාවලිය සහ තොරතුරු | 17 - 20 |
| 11. | අළෙවි අංශය | 21 - 23 |
| 12. | අවසන් ඉලක්කය | 24 |
| 13. | 2017 වර්ෂය තුළ අත් කරගත් ජයග්‍රහණ හා 2018 වර්ෂයේ සාර්ථකත්වය වෙනුවෙන් යෝජනා | 25 |
| 14. | ස්තුතිය | 26 |
| 15. | වාර්ෂික මූල්‍ය ප්‍රකාශය | 27 - 47 |
| 16. | විගණකාධිපති වාර්තාව | 48 - 50 |

# අපගේ දැක්ම

ශ්‍රී ලාංකේය පොදු ජනතාව

මන්දපෝෂණයෙන් තොර

සෞභාග්‍යමත් අභිමානවත්

නිරෝගීමත් පෝෂිත

ජාතියක් බවට පත් කිරීම

# අපගේ මෙහෙවර

ආශ්චර්ය සපිරි හෙට දවස ලෝකය දිනවන
අප මාතෘ භූමියෙහි
සෞභාග්‍යමත්, තෙදවත්, ගුණවත්
ශ්‍රී ලාංකේය ජාතික අනාගතය උදෙසා
රාජ්‍ය භාණ්ඩාගාරයේ අනු දැනුමැතිව
සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහාය, අධීක්ෂණය
පරිපූර්ණව,
ස්වදේශීය ගොවියා බලසතු කරන
සැපයුම්කාරක බලමුළු සවි ගන්වා
උසස් නියමානුකූල ප්‍රමිති ගුණ පෝෂිත
ත්‍රිපෝෂ අතුරු ආහාරය
මනාව සෞඛ්‍ය ආරක්ෂිතව සාදවා, අසුරා, නිමවා,
සුවගුණ අපේක්ෂිත
ප්‍රතිලාභි ජන හිත සුව පිණිස ම
අඛණ්ඩව සපයා ප්‍රදානය කිරීම ද
සම්භාව්‍ය සේවා අභිමානයෙන් ඇප කැප වූ
මහ ක්‍රියාන්විත මෙහෙයුමකින්
දේශය ද - විශ්වය ද
ජය ගන්නා
යහපත් ත්‍රිපෝෂ පවුලක් වීම ද
විශ්වවිය සෞඛ්‍ය දර්ශක ඉලක්ක සපුරන
සෞඛ්‍ය සම්පන්න ශ්‍රී ලාංකේය ජාතියක පැවැත්ම
පිණිස විශිෂ්ඨ ලෙස කැපවූ ද
පළමු හා එකම දේශීය සමාගම වීම

# ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් හි සභාපතිතුමාගේ පණිවිඩය



පෝෂණයෙන් සපිරි නිරෝගිමත් ජනතාවක් බිහි කිරීමේ ජාතික මෙහෙවර ඉටු කිරීම උදෙසා ත්‍රිපෝෂ අතිරේක ආහාරය නිෂ්පාදනය කොට සෞඛ්‍ය සායන මගින් ශ්‍රී ලංකාවේ වෙසෙන සියළුම ගර්භනී මව්වරුන්, කිරිදෙන මව්වරුන් හා වයස අවුරුදු 05ට අඩු, බර අඩු දරුවන් උදෙසා නොමිලේ බෙදා හැරීම ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ආයතනය විසින් සිදු කරනු ලබන ප්‍රමුඛ ජාතික මෙහෙවරකි.

මෙම ජාතික මෙහෙවරට උරදිමට  2015 වසරේදි මා හටද අවස්ථාවක් ලැබුණි. 2015 වසරේ ගරු සෞඛ්‍ය අමාත්‍යතුමා ත්‍රිපෝෂ සමාගමේ සභාපති වශයෙන් මා පත් කළ අවස්ථාවේදි මාගේ ප්‍රධානතම ඉලක්කය වුයේ නොමිලේ ලබා දෙන ත්‍රිපෝෂ අවශ්‍යතාවය 100% ඉලක්කය සුපරා ගැනිමය. ඒ සඳහා නව යන්ත්‍ර සූත්‍ර පද්ධතියක් සවි කිරීම 2016 වර්ෂයේදි සිදු කළ අතර එහි ප්‍රතිඵලයක් ලෙස නොමිලේ ලබා දෙන 100% ඉලක්කය අභිබවමින් අතිරික්ත නිෂ්පාදනයක්ද උත්පාදනය විය. එම අතිරික්තය වෙළඳපලට නිකුත් කිරීමට ගරු සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍ය රාජිත සේනාරත්න මැතිතුමා අප දිරිගැන්වීමේ ප්‍රතිඵලය වුයේ කොටසකට පමණක් සීමා වු ත්‍රිපෝෂ නව වෙළඳ නාමයකින් එනම් සුපෝෂ නමින් වෙළඳපලට හඳුන්වා දිමට හැකි විමයි.

ගුණාත්මක බවින් ඉතා උසස් මට්ටමක ඇති මෙම සුපෝෂ අතිරේක පෝෂ්‍යදායි ආහාරය විශේෂයෙන්ම පාසැල් සිසුන්ටත්, වැඩකරන ජනතාවටත් සහනදායි මිලකට මිළඳී ගැනිමට හැකි වන හෙයින් ඔවුනට මහත් ප්‍රයෝජනයක් ඉන් සිදු වනවා ඇත.

දේශීය වෙලඳපල පමණක් නොව විදේශ වෙළඳපල කරා යාමේ අපගේ මිළග ඉලක්කයේ පළමු පියවර වශයෙන් වන බෙදාහැරීමේ නියෝජිතයින් 4 කින් ව්‍යාපෘතිය අරඹා මෙම ව්‍යාපෘතිය මේ වන විට ශ්‍රී ලංකාව පුරාම පුලුල්ව ව්‍යාප්තව ඇත. නියෝජිතයින් 40 ක පමණ පුලුල් ජාලයක් අප සතුව ඇති අතර මේ සියලු කාර්යයන් කරනුයේ නොමිලේ ලබා දෙනු ලබන ත්‍රිපෝෂ හිමි ප්‍රතිලාභීන්ට සම්පූර්ණයෙන් එය ලබා දිමෙන් පසුව විම අප ලබන සුවිශේෂිම ජයග්‍රහණයයි.

මෙම  අපහසු ඉලක්කයන් ඉතා කෙටි කාලයක් තුල ජයග්‍රහණය කිරීමට මා දිරිමත් කල අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා, ගරු සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය වෛද්‍ය රාජිත සේනාරත්න මැතිතුමා, අපගේ අධ්‍යක්ෂ මණ්ඩලය ඇතුළු සමස්ත සේවක මණ්ඩලය හා අඛණ්ඩ නිෂ්පාදනයක් උදෙසා නිසිකලට අමුද්‍රව්‍ය සපයන අපගේ සැපයුම්කරුවන් හා අපහට නන් අයුරින් සහය දක්වන සියළු දෙනා කෘතඥ පූර්වකව සිහි කරමි.

එම්. ඩී. බන්දුසේන
සභාපති
ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

# ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්
# අධ්‍යක්ෂ මණ්ඩලය - 2017

- සභාපති, එම්. ඩී. බන්දුසේන මහතා

- අධ්‍යක්ෂ, වෛද්‍ය ජේ. එම්. ඩබ්ලිව්. ජයසුන්දර බණ්ඩාර මහතා
  සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
  සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

- අධ්‍යක්ෂිකා, වෛද්‍ය ශාන්ති ගුණවර්ධන මහත්මිය
  අධ්‍යක්ෂිකා පෝෂණ සම්බන්ධීකරණ අංශය
  සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

- අධ්‍යක්ෂිකා, නීතිඥ එච්. එම්. චමින්දිකා හේරත් මෙනවිය
  නීති නිළධාරිනී
  සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

- අධ්‍යක්ෂිකා, තේජා හේරත් මහත්මිය
  ජ්‍යේෂ්ඨ පර්යේෂණ නිළධාරිනී
  කාර්මික තාක්ෂණ ආයතනය

- අධ්‍යක්ෂිකා, වෛද්‍ය දමයන්ති හපුගොඩ මහත්මිය
  ළමා රෝග විශේෂඥ
  පානදුර මහ රෝහල

- දර්ශන විජේසිරිවර්ධන මහතා
  සහකාර අධ්‍යක්ෂ
  ජාතික අයවැය දේපාර්තමේන්තුව - මුදල් අමාත්‍යාංශය

- නිරීක්ෂක, එස්. ආර්. රාජපක්ෂ මහතා
  ප්‍රධාන ගණකාධිකාරී
  සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

- තනූජා ප්‍රියදර්ශනි අල්විස් මහත්මිය
  අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

# ත්‍රිපෝෂ ආයතනය කෙටියෙන් හඳුනා ගනිමු

- **ලිපිනය** - තැ.පෙ. 17, කොළඹ පාර,
  කපුවත්ත, ජා-ඇල
- **දුරකථන** - 0112 - 236588
  0112 - 237418
  0112 - 233451
- **ෆැක්ස් අංකය** - 0112 - 237363
- **ඊ-මේල් ලිපිනය** - **thriposha@gmail.com**
- **අමාත්‍යාංශය** - සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
- **ආයතනයේ ස්වභාවය** - සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින පූර්ණ රාජ්‍ය සමාගමකි
- **සමාගම් ලියාපදිංචි අංකය** - PB /3873
- **ප්‍රධාන නිෂ්පාදනය** - නොමිලේ ලබා දෙන පෝෂණ ගුණයෙන් හා සෞඛ්‍යයෙන් පිරිපුන් ත්‍රිපෝෂ අතිරේක ආහාරය හා අලෙවිය සඳහා සුපෝෂ
- **ත්‍රිපෝෂ බෙදා හැරීමේ මධ්‍යස්ථාන** -
  - * දිවයින පුරා ඇති සෞඛ්‍ය වෛද්‍ය මධ්‍යස්ථාන
  - * වතු
  - * පරිවාස හා ළමා රක්ෂණ මධ්‍යස්ථාන
- **සුපෝෂ නියෝජිතායන**
- **බෙදා හරිනු ලබන ආකාරය** - දුම්රිය වැගන් හා ලොරි රථ මගින්
- **ප්‍රතිලාභීන්** -
  - * සියලුම ගර්භනී හා කිරිදෙන මව්වරුන්
  - * මව්වරුන්
  - * පෝෂණ අවශ්‍යතා සහිත ළමුන්
  - * ඇතැම් රෝගීන්
- **මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව** - දශ ලක්ෂය ඉක්මවා ඇත
- **බැංකුව** - ලංකා බැංකුව
- **විගණක** - විගණකාධිපති
  විගණකාධිපති දෙපාර්තමේන්තුව
  අංක 306/72, පොල්දූව පාර
  බත්තරමුල්ල

# ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම
# විගණන හා කළමනාකරණ කමිටුව - 2017

- දර්ශන විජේසිරිවර්ධන මහතා
  සභාපති - විගණන හා කළමනාකරණ කමිටුව
  අධ්‍යක්ෂ - ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

- වෛද්‍ය ශාන්ති ගුණවර්ධන මහත්මිය
  සාමාජික - විගණන හා කළමනාකරණ කමිටුව
  අධ්‍යක්ෂිකා - ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

- නීතිඥ එච්. එම්. චමින්දිකා හේරත් මෙනවිය
  සාමාජික - විගණන හා කළමනාකරණ කමිටුව
  අධ්‍යක්ෂිකා - ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

- එස්. ආර්. රාජපක්ෂ මහතා
  නිරීක්ෂක - විගණන හා කළමනාකරණ කමිටුව
  ප්‍රධාන ගණකාධිකාරි සෞඛ්‍ය අමාත්‍යාංශය

- එන්. එල්. ජයසිංහ මහත්මිය
  සහකාර ගණකාධිකාරී
  ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

- එල්. ජේ. එස්. ප්‍රේමචන්ද්‍ර මහතා
  කැදවුම්කරු - විගණන හා කළමනාකරණ කමිටුව

  අභ්‍යන්තර විගණක - ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

## *ප්‍රධාන ප්‍රසම්පාදන කමිටුව*
## *(රුපියල් මිලියන 60 දක්වා)*

- සභාපති
  ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

- සචින්ද්‍ර කුරේ මහතා
  අධ්‍යක්ෂ (මුදල්) සැපයීම්
  සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

- වෛද්‍ය ආර්. හෙට්ටිආරච්චි මහත්මිය
  අධ්‍යක්ෂ - පෝෂණ සම්බන්ධීකරන අංශය
  සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

## *සුළු ප්‍රසම්පාදන කමිටුව*
## *(රුපියල් මිලියන 10 දක්වා)*

- ජ්‍යේෂ්ඨ කළමනාකරු (මෙහෙයුම්)
  ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

- ජ්‍යේෂ්ඨ කළමනාකාරිණී (මානව සම්පත් හා නීති)
  ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

- සහකාර ගණකාධිකාරිණී
  ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

# ත්‍රිපෝෂ ආයතනයේ ඉතිහාසය හා වර්තමාන ප්‍රගතිය

ත්‍රිපෝෂ ආයතනයේ කළමනාකරණ කටයුතු සෞඛ්‍ය අමාත්‍යාංශයට 1976 වර්ෂයේ දී පැවරුණි. කළමනාකරණ කාර්යයන් සඳහා ටෙන්ඩර් කැඳවන ලද අතර, ඒ සඳහා ලංකා දුම්කොළ සමාගම තෝරා ගනු ලැබී ය. එතැන් සිට 2010 වර්ෂය දක්වාම මෙහි පාලන කටයුතු ලංකා දුම්කොළ සමාගම විසින් සිදු කරන ලදි. මෙම ව්‍යාපෘතිය සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ දායකත්වය වඩාත් ළං කරමින් ත්‍රිපෝෂ කර්මාන්ත ශාලාවේ නඩත්තු වියදම් ප්‍රතිපූර්ණය කිරීමේ කටයුතු 1987 වර්ෂයේ සිට සිදු විය. එමෙන්ම ත්‍රිපෝෂ කර්මාන්තශාලාව සතු භූමි භාගය යන්ත්‍රෝපකරණ හා අනෙකුත් සම්පත් සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් විය.

රටේ මන්දපෝෂණය තුරන් කරලීමේ ජාතික වැඩසටහන වඩාත් සවිබල ගැන්වීමේ අරමුණින් ත්‍රිපෝෂ ආයතනය රජයට පවරාගෙන එහි නිෂ්පාදන කටයුතු වැඩි දියුණු කිරීමට රජයේ අවධානය යොමු විය. එවක සිටි සෞඛ්‍ය අමාත්‍ය, වර්තමාන ජනාධිපති අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයක් සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබීමෙන් පසු 2010.09.17 දින සිට පූර්ණ රාජ්‍ය සමාගමක් ලෙසින් මෙම ත්‍රිපෝෂ ආයතනය **"ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්"** නමින් සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ස්ථාපිත විය. අංක පී.බී./3873 යටතේ සෞඛ්‍ය අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතනයක් ලෙසින් සමාගම් රෙජිස්ට්‍රාර්වරයා යටතේ නව සමාගම ලියාපදිංචි කරන ලදි. ඉන්පසු 2011.01.01 දින සිට සාමාජිකයින් 07 දෙනෙකුගෙන් සමන්විත නව අධ්‍යක්ෂ මණ්ඩලයක් යටතේ ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ කටයුතු ආරම්භ කරන ලදි.

## නිෂ්පාදන ප්‍රගතිය

2011 වර්ෂයේ රජයට පවරා ගන්නා අවස්ථාවේදී ශ්‍රී ලංකාව තුළ ත්‍රිපෝෂ ලැබීමට හිමිකම ඇති සම්පූර්ණ ප්‍රතිලාභීන් සංඛ්‍යාව 928,000ක් වේ. මෙම ප්‍රතිලාභීන්,

- සියලුම ගර්භනී මව්වරුන්
- සියලුම කිරිදෙන මව්වරුන් (ළදරුවාට මාස 06ක් ගත වනතුරු)
- මන්ද පෝෂණයෙන් පෙළෙන මාස 06ට වැඩි ළදරුවන් සහ අවුරුදු 05ට අඩු පෙර පාසල් ළදරුවන්
- බර අනුව ළමා වර්ධක සටහනේ 3වන ශතක රේඛාවට පහළින් සිටින ළමුන්
- ඉහත කාණ්ඩයට අයත් රෝහල්ගත රෝගීන් යන අයගෙන් සමන්විත වේ.

ඉහත කී ත්‍රිපෝෂ ප්‍රතිලාභීන් වෙත සම්පූර්ණයෙන් මසකට අවශ්‍ය ත්‍රිපෝෂ සැපයීමට මසකට ත්‍රිපෝෂ මෙ.ටො. 1,392ක් නිෂ්පාදනය කළ යුතු වේ. 2010 සැප්තැම්බර් මාසය දක්වා ත්‍රිපෝෂ ආයතනය රජයට පවරා ගැනීමට පෙර මසක නිෂ්පාදනය මෙ.ටො. 731ක් විය. 2010 සැප්තැම්බර් මස සමාගම රජයට පවරා ගැනීමත් සමග නිෂ්පාදනයේ

විශාල වැඩිවීමක් සිදු විය. නවීන යන්ත්‍රසූත්‍ර ස්ථාපනය හා සේවක දිරි ගැන්වීම් ආදිය මෙම නිෂ්පාදන ඉහළ යාමට හේතු විය. ඒ අනුව යමින් 2017 වර්ෂයේ මුළු ත්‍රිපෝෂ නිෂ්පාදනය මෙ.ටො. 12,239ක් දක්වා ඉහළ නැංවීමට හැකි වූ අතර වෙළඳ පොලට හඳුන්වාදුන් නව නිෂ්පාදනය වන සුපෝෂ මෙ.ටො. 58ක් 2017 වර්ෂයේ නිෂ්පාදනය කරන ලදි.

2017 වර්ෂයේ මාසික ප්‍රතිලාභී සංඛ්‍යාව මිලියනයක් බවට ගණන් බලා ඇති අතර, ඒ සඳහා මසක නිෂ්පාදන අවශ්‍යතාවය මෙ.ටො. 1,500ක් වනු ඇත. මෙම අවශ්‍යතා සාක්ෂාත් කර අතිරික්තය දේශිය වෙළඳපොළට හඳුන්වාදිම වාර්තමාන ඉලක්කය වේ. මෙය ඉතා පහසු ඉලක්කයක් වනුයේ පහත සඳහන් වැඩපිළිවෙලවල් මේ වන විටත් ක්‍රියාත්මක කර අවසන් බැවිනි.

## ඉලක්ක සපුරා ගැනිම සඳහා දියත් කරන ලද ක්‍රියාමාර්ග

01 පැරනි බ්‍රේඩ් යන්ත්‍රය ගලවා දැනට භාවිතා කරන ඇන්ඩර්සන් යන්ත්‍රය මෙන් දෙගුණයක ධාරිතාවය ඇති නව ඇන්ඩර්සන් යන්ත්‍රයක් ඇමෙරිකාවෙන් ආනයනය කර දැනටමත් ස්ථාපිත කර නිෂ්පාදන කටයුතු ආරම්භ කර තිබීම

02 නව යන්ත්‍ර පද්ධතියට සරිලන පරිදි පැරනි ගොඩනැගිල්ල අළුත් වැඩියා කර තිබීම

03 නව යන්ත්‍ර පද්ධතිය ක්‍රියා කරවීමට හැකිවන පරිදි නව ට්‍රාන්ස්පෝමරයක් සහ එහි පැනල් පද්ධතිය සඳහා ගොඩනැගිල්ලක් ස්ථාපිත කර තිබීම

04 අමුද්‍රව්‍ය හා නිමිද්‍රව්‍ය බෑමට, පැටවීමට හා එහා මෙහා ගෙනයාමට පහසු වන පරිදි නව ෆෝක් ලිෆ්ට් යන්ත්‍ර දෙකක් මිලදි ගෙන තිබීම

05 ත්‍රිපෝෂ නිෂ්පාදනය ඉතා කාර්යක්ෂමව, නිවැරදිව සහ ඉතා පහසුවෙන් ඇසුරුම් කිරිමට හැකි වන පරිදි නව ඇසුරුම් යන්ත්‍ර දෙකක් මිලදි ගෙන තිබීම

06 වර්තමානය වන විට දිවයිනේ දිස්ත්‍රික්ක 15ක් ආවරණය වන පරිදි නව සුපෝෂ අලෙවි නියෝජිත ජාලයක් ඇති කිරිම

07 බෙදා හැරිමේ කටයුතු පහසු කිරිම සහ වේගවත් කිරිම සඳහා ලොරි රථයක් මිලදි ගැනිම

08 අතිරික්ත නිෂ්පාදනය වන සුපෝෂ අලෙවි කිරිම සඳහා නව වෙළඳ කුටියක් විවෘත කිරිම

# මුදල් අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත සේවා ගණන, තනතුරු හා අනුමත සේවක සංඛ්‍යාව

| | | | |
|---|---|---|---|
| **01** | **ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්** | | |
| | • ජ්‍යෙෂ්ඨ කළමනාකරු (මෙහෙයුම්) | 01 | |
| | • ජ්‍යෙෂ්ඨ කළමනාකරු (මානව සම්පත් හා නීති) | 01 | 02 |
| **02** | **මධ්‍යම මට්ටමේ කළමනාකරුවන්** | | |
| | • කළමනාකරු (ඉංජිනේරු හා නිෂ්පාදන සේවා) | 01 | |
| | • කළමනාකරු (තත්ත්ව පාලන) | 02 | |
| | • කළමනාකරු (මුදල්) | 01 | |
| | • කළමනාකරු (අලෙවි ප්‍රවර්ධන) | 01 | 05 |
| **03** | **කනිෂ්ඨ කළමනාකරුවන්** | | |
| | • බෙදාහැරීමේ නිළධාරි | 01 | |
| | • අභ්‍යන්තර විගණක නිළධාරි | 01 | |
| | • මුදල් නිළධාරි | 01 | |
| | • සැපයීම් නිළධාරි | 01 | |
| | • ගබඩා නිළධාරි | 01 | |
| | • ගුදම් ගබඩා නිළධාරි | 01 | |
| | • නිෂ්පාදන නිළධාරි | 03 | |
| | • පරිපාලන නිළධාරි | 01 | |
| | • ගිණුම් නිළධාරි | 01 | |
| | • ඉංජිනේරු සේවා නිළධාරි | 01 | 12 |
| **04** | **කළමනාකරණ සහකාර (තාක්ෂණ)** | | 04 |
| **05** | **කළමනාකරණ සහකාර (තාක්ෂණ නොවන)** | | 18 |
| **06** | **ප්‍රාථමික සේවා** | | |
| | ප්‍රාථමික සේවා (ශිල්පීය) | | |
| | • රියදුරු | 07 | |
| | • විදුලි කාර්මික | 04 | 11 |
| | ප්‍රාථමික සේවා (අර්ධ ශිල්පීය) | | |
| | • බොයිලේරුකරුවන් | 03 | |
| | • පිටර්වරුන් | 03 | |
| | • ලේත් යන්ත්‍රකරුවන් | 02 | |
| | • යන්ත්‍ර ක්‍රියාකරු | 28 | |
| | • තත්ත්ව පරීක්ෂක | 07 | |
| | • ගිනි නිවීමේ උපස්ථායක | 01 | |
| | • ෆෝක්ලිෆ්ට් යන්ත්‍ර ක්‍රියාකරු | 02 | 46 |
| | ප්‍රාථමික සේවා (ශිල්පීය නොවන) | | |
| | • උද්‍යානකරු | 02 | |
| | • කම්කරු/කාර්යාල සහායක | 02 | |
| | • සාමාන්‍ය කම්කරු | 129 | |
| | • කම්කරු පාලිකා | 01 | 134 |
| **එකතුව** | | | **232** |

# අපගේ කණ්ඩායම සේවා අනුව විහිදී ඇති ආකාරය මෙසේය

- **නිෂ්පාදනාගාරය**

(කණ්ඩායමට ඇතුළත් පිරිස 205)

| | තනතුරු | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | ජ්‍යෙෂ්ඨ කළමනාකරු (මෙහෙයුම්) | 01 |
| 02 | කළමනාකරු (ඉංජිනේරු සේවා හා නිෂ්පාදන) | 01 |
| 03 | කළමනාකරු (තත්ත්ව ආරක්ෂක) | 02 |
| 04 | ගුදම් ගබඩා නිළධාරි | 01 |
| 05 | නිෂ්පාදන නිළධාරීන් | 03 |
| 06 | ගබඩා නිළධාරීන් | 01 |
| 07 | බෙදාහැරීමේ නිළධාරීන් | 01 |
| 08 | ඉංජිනේරු සේවා නිළධාරි | 01 |
| 09 | කළමනාකරණ සහාකාරවරුන් | 14 |
| 10 | විදුලි කාර්මිකයින් | 04 |
| 11 | ගිනි නිවීමේ උපස්ථායකයින් | 01 |
| 12 | ෆෝක්ලිෆ්ට් යන්ත්‍ර ක්‍රියාකරු | 02 |
| 13 | තත්ත්ව පරීක්ෂකයින් | 07 |
| 14 | යන්ත්‍ර ක්‍රියාකරුවන් | 28 |
| 15 | ලේත් යන්ත්‍රකරුවන් | 02 |
| 16 | පිටර්වරුන් | 03 |
| 17 | බොයිලේරුකරුවන් | 03 |
| 18 | සාමාන්‍ය කම්කරුවන් | 130 |
| **එකතුව** | | 205 |

- **පරිපාලන, ගිණුම් හා වෙනත් අංශ**

**(කණ්ඩායමට ඇතුළත් පිරිස 27)**

| | තනතුරු | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | ජ්‍යෙෂ්ඨ කළමනාකරු (මානව සම්පත් හා නීති) | 01 |
| 02 | කළමනාකරු (මූල්‍ය) | 01 |
| 03 | කළමනාකරු (අලෙවි ප්‍රවර්ධන) | 01 |
| 04 | මුදල් නිළධාරි | 01 |
| 05 | ගිණුම් නිළධාරි | 01 |
| 06 | අභ්‍යන්තර විගණන නිළධාරි | 01 |
| 07 | පරිපාලන නිළධාරි | 01 |
| 08 | සැපයුම් නිළධාරි | 01 |
| 09 | කළමනාකරණ සහාකාරවරුන් | 08 |
| 10 | රියදුරන් | 07 |
| 11 | කාර්යාල සහායක | 02 |
| 12 | උද්‍යානකරු | 02 |
| **එකතුව** | | 27 |

# 2017 වර්ෂයේ සැපයුම්කරුවන් පිළිබඳ විස්තර

**සෝයා බෝංචි හා බඩඉරිඟු**

1. **ගොවි මධ්‍යස්ථානය**
   **මිගලෑව**
   නො: 367
   03 මහළ ඩැම් විදිය
   කොළඹ 12

2. **එස්. ඩි. කේ. යුනයිටඩ් ඇග්‍රිවෙන්චස් (ප්‍රයිවට්) ලිමිටඩ්**
   පන්ඩුලගම
   අනුරාධපුර

3. **ඒකාබද්ධ ගොවි සංවිධානය**
   **අම්පාර**
   නො: 169, දුටු ගැමුණු මාවත
   පෑලියගොඩ

4. **ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය**
   නො: 583
   සාන්ත ජුඩ් මාවත
   රිලවුල්ල
   කඳාන

5. **එස්. බි. එම්. ලංකා ට්‍රේඩින් (ප්‍රයිවට්) ලිමිටඩ්**
   නො : 184/1
   වේල්ල වීදිය
   කොළඹ 12

01. **කිරි පිටි**
    මිල්කෝ සමාගම
    නො: 45
    නාවල පාර
    නාරාහේන්පිට

02. **විටමින් සහ මිනරල්**

    ජේ.කේ. ට්‍රේඩිලින්ක් (ප්‍රයිවට්) ලිමිටඩ්
    නො: 44
    තලවතුගොඩ පාර
    පිටකෝට්ටේ

03. **ක්‍රාෆ්ට් පෙපර්**
    අබ්දුල්ලා ඉන්ඩ්‍රස්ට්‍රික්ස් පැකේජින් (ප්‍රයිවට්) ලිමිටඩ්
    නො: 72
    මහ විද්දියාල මාවත
    කොළඹ 13


04. **පොලිතින්**
    නිව් ජීවා ඉන්ඩස්ට්‍රි (ප්‍රයිවට්) ලිමිටඩ්
    පොල්වත්ත
    කුණ්ඩසාලේ
    මහනුවර

    **සෙල්මෝ (ප්‍රයිවට්) ලිමිටඩ්**
    59/1, නාරම්පොළ පාර,
    මොරගල, දෙකටන


## 2013 වසරේ සිට 2017 වසර දක්වා ත්‍රිපෝෂ සහ සුපෝෂ නිෂ්පාදනය (කිලෝ ග්‍රෑම්)

| මාසය | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|---|
| ජනවාරි | 968,085 | 907,110 | 1,077,773 | 1,294,695 | 1,265,310 |
| පෙබරවාරි | 992,453 | 1,073,430 | 982,778 | 1,201,860 | 1,086,480 |
| මාර්තු | 1,005,773 | 1,280,633 | 1,197,135 | 1,246,725 | 1,308,375 |
| අප්‍රේල් | 495,405 | 866,070 | 948,960 | 1,001,273 | 1,105,286 |
| මැයි | 676,553 | 1,270,260 | 1,290,758 | 1,187,033 | 1,180,947 |
| ජුනි | 750,825 | 1,162,215 | 1,201,343 | 354,533 | 958,843 |
| ජුලි | 1,356,413 | 1,289,453 | 1,372,500 | - | 1,240,006 |
| අගෝස්තු | 1,247,153 | 1,297,733 | 1,298,678 | 68,850 | 1,348,335 |
| සැප්තැම්බර් | 1,321,020 | 1,296,473 | 1,354,095 | 856,598 | 974,121 |
| ඔක්තෝබර් | 1,124,055 | 1,316,745 | 1,403,573 | 873,135 | 749,472 |
| නොවැම්බර් | 952,830 | 1,267,290 | 1,370,430 | 1,066,320 | 1,372,774 |
| දෙසැම්බර් | 410,355 | 946,620 | 1,094,243 | 650,205 | 855,172 |
| **එකතුව කිලෝ ග්‍රෑම්** | **11,300,920** | **13,974,030** | **14,592,263** | **9,801,225** | **13,445,119** |
| **එකතුව මෙ. ටොන්** | **11,300** | **13,974** | **14,592** | **9,801** | **13,445** |


## 2013 වර්ෂයේ ප්‍රස්තාර ගත නිෂ්පාදන දත්ත ( කිලෝ ග්‍රෑම් )




**2014 වර්ෂයේ ප්‍රස්තාර ගත නිෂ්පාදන දත්ත ( කිලෝ ග්‍රෑම් )**





**2015 වර්ෂයේ ප්‍රස්තාර ගත නිෂ්පාදන දත්ත ( කිලෝ ග්‍රෑම් )**



**2016 වර්ෂයේ ප්‍රස්තාර ගත නිෂ්පාදන දත්ත ( කිලෝ ග්‍රෑම් )**




**2017 වර්ෂයේ ප්‍රස්තාර ගත නිෂ්පාදන දත්ත ( කිලෝ ග්‍රෑම් )**




2017 වර්ෂයේ අප්‍රේල් මස සිට සුපෝෂ නිෂ්පාදනය ආරම්බ කිරීමට කටයුතු කරන ලදි

වසර 40 ක් පමන පැරණි බිරේඩ් යන්ත්‍රය වෙනුවට ඇමරිකාවෙන් ආනයනය කරන ලද නව ඇන්ඩර්සන් යන්ත්‍ර පද්ධතිය ස්ථාපිත කිරීමත් සමග 2017 වර්ෂයේදි ත්‍රිපෝෂ නිෂ්පාදනය පමනක් මෙ. ටොන් 12,239 දක්වා වැඩිකර ගැනිමට හැකි වි ඇත.

## 2018 අපේක්ෂිත ඉලක්කය

- නොමිලේ ලබා දෙනු ලබන ත්‍රිපෝෂ සියලුම ප්‍රතිලාභින්ට ලබාදිමේ 100% ඉලක්කය ජයගැනිම.

- දේශිය ගොවියා තව තවත් සුරක්ෂිත කිරිමේ අරමුණ පෙරදැරිව ඔවුන්ගේ නිෂ්පාදන ගොවි සංවිධාන වෙතින් ත්‍රිපෝෂ ආයතනයට සපයා ගැනිම

- අප සතු සුපෝෂ අළෙවි නියෝජිත ජාලය පුළුල් කිරිම.

- නව ලොරි රථයක් මිලදි ගෙන බෙදා හැරිම ඉතා කාර්‍යක්‍ෂමව සිදු කිරිම

**2018 වර්ෂයේ ත්‍රිපෝෂ නිෂ්පාදනය පහත අයුරින් ඉහළ නැංවිම ආයතනයේ ඒකායන අපේක්ෂාවයි.**

| **මාසය** | **2018** | |
|---|---|---|
| | **මාස්ටර් බෑග්ස්** | **පැකට්(ග්‍රෑම් 750)** |
| ජනවාරි | 62,196 | 1,865,880 |
| පෙබරවාරි | 67,596 | 2,027,880 |
| මාර්තු | 70,476 | 2,114,280 |
| අප්‍රේල් | 62,196 | 1,865,880 |
| මැයි | 73,356 | 2,200,680 |
| ජුනි | 73,356 | 2,200,680 |
| ජුලි | 76,236 | 2,287,080 |
| අගෝස්තු | 74,796 | 2,243,880 |
| සැප්තැම්බර් | 75,876 | 2,276,280 |
| ඔක්තෝබර් | 75,876 | 2,276,280 |
| නොවැම්බර් | 72,996 | 2,189,880 |
| දෙසැම්බර් | 61,836 | 1,855,080 |
| **එකතුව** | **846,792** | **25,403,760** |

# ත්‍රිපෝෂ බෙදා හැරීමේ ක්‍රියාවලිය

## ත්‍රිපෝෂ කර්මාන්ත ශාලාව (ජා-ඇල)



බෙදාහැරීමේ කටයුතු කිරීම (ලොරි රථ මගින් හා දුම්රිය වැගන් මගින්)







ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්

වතු

ළමා මධ්‍යස්ථාන

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී

සෞඛ්‍ය මධ්‍යස්ථාන (සායන)

පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනිය







**ත්‍රිපෝෂ ප්‍රතිලාභීන්**

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම මගින් ත්‍රිපෝෂ නිෂ්පාදනය සිදු කර සෞඛ්‍ය අමාත්‍යාංශය හරහා ක්‍රමානුකුලව බෙදාහැරීම් කටයුතු සිදු කරනු ලැබේ.

## ත්‍රිපෝෂ බෙදාහැරීමේ මධ්‍යස්ථාන

### පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ බල ප්‍රදේශ

1. මධ්‍යම පළාත
2. නැගෙනහිර පළාත
3. උතුරු මැද පළාත
4. වයඹ පළාත
5. උතුරු පළාත
6. සබරගමුව පළාත
7. දකුණු පළාත
8. ඌව පළාත
9. බස්නාහිර පළාත

### වතු අධිකාරී

1. හැටන්
2. මාතලේ
3. කෑගල්ල
4. මහනුවර
5. කළුතර
6. නුවර එළිය
7. මාතර
8. බදුල්ල
9. ගාල්ල
10. රත්නපුර

### වෙනත්

1. හමුදා රෝහල්
2. පොලිස් රෝහල්
3. ළදරු පාසල්
4. නගර සභා
   - මීගමුව
   - කොළඹ
   - මාතලේ
   - ගාල්ල
   - නුවර

### පරිවාස හා ළමා ආරක්ෂණ අධිකාරී

1. අනුරාධපුරය
2. බත්තරමුල්ල
3. බදුල්ල
4. ගාල්ල
5. යාපනය
6. ත්‍රිකුණාමලය
7. කුරුණෑගල
8. රත්නපුර
9. කෑගල්ල
10. නුවර

### ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ බල ප්‍රදේශ

1. අම්පාර
2. අනුරාධපුරය
3. බදුල්ල
4. මඩකලපුව
5. කොළඹ
6. ගාල්ල
7. ගම්පහ
8. හම්බන්තොට
9. යාපනය
10. කල්මුණේ
11. කළුතර
12. රත්නපුර
13. ත්‍රිකුණාමලය
14. මහනුවර
15. කෑගල්ල
16. කිලිනොච්චිය
17. කුරුණෑගල
18. මාතලේ
19. මාතර
20. මන්නාරම
21. මොණරාගල
22. නුවර එළිය
23. පොළොන්නරුව
24. පුත්තලම
25. වව්නියාව

### සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශ ගනන

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. අම්පාර | 07 | 10. කල්මුණේ | 13 | 19. මාතර | 16 |
| 2. අනුරාධපුරය | 18 | 11. කළුතර | 13 | 20. මන්නාරම | 03 |
| 3. බදුල්ල | 15 | 12. රත්නපුර | 17 | 21. මොණරාගල | 11 |
| 4. මඩකලපුව | 13 | 13. ත්‍රිකුණාමලය | 10 | 22. නුවර එළිය | 11 |
| 5. කොළඹ | 11 | 14. මහනුවර | 21 | 23. පොළොන්නරුව | 07 |
| 6. ගාල්ල | 19 | 15. කෑගල්ල | 11 | 24. පුත්තලම | 11 |
| 7. ගම්පහ | 16 | 16. කිලිනොච්චිය | 04 | 25. වව්නියාව | 04 |
| 8. හම්බන්තොට | 12 | 17. කුරුණෑගල | 23 | | |
| 9. යාපනය | 11 | 18. මාතලේ | 12 | | |

## 2017 වර්ෂයේ ත්‍රිපෝෂ බෙදා හැරීමේ තොරතුරු

| ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ බල ප්‍රදේශ | ප්‍රතිලාභින් සංඛ්‍යාව | වසරකට වෙන් කරනු ලබන ප්‍රමාණය (මෙ.ටො) | | |
|---|---|---|---|---|
| | | මව්වරුන්ට | ළමයින්ට | එකතුව |
| අම්පාර | 26,508 | 4,137 | 8,366 | 12,503 |
| අනුරාධපුරය | 56,835 | 8,607 | 18,138 | 26,745 |
| බදුල්ල | 39,904 | 5,460 | 13,544 | 19,004 |
| මඩකලපුව | 44,820 | 5,738 | 16,458 | 22,196 |
| කොළඹ රෝහල | 4,373 | 527 | 2,884 | 3,411 |
| කොළඹ නගර සභාව | 8,731 | 1,029 | 7,101 | 8,130 |
| කොළඹ (දකුණ) | 43,753 | 7,754 | 24,567 | 32,321 |
| ගාල්ල | 47,290 | 8,044 | 16,044 | 24,088 |
| ගම්පහ | 55,650 | 16,182 | 24,083 | 40,265 |
| හම්බන්තොට | 37,566 | 4,591 | 14,259 | 18,850 |
| යාපනය | 33,062 | 3,474 | 8,511 | 11,985 |
| කල්මුණේ | 34,585 | 5,828 | 11,903 | 17,731 |
| කළුතර | 36,790 | 8,100 | 18,026 | 26,126 |
| මහනුවර | 61,473 | 9,346 | 18,377 | 27,723 |
| කෑගල්ල | 29,681 | 4,655 | 12,099 | 16,754 |
| කිලිනොච්චිය | 7,987 | 1,472 | 2,940 | 4,412 |
| කුරුණෑගල | 70,345 | 10,703 | 21,425 | 32,128 |
| මන්නාරම | 10,224 | 1,518 | 4,428 | 5,946 |
| මාතලේ | 32,314 | 3,749 | 12,409 | 16,158 |
| මාතර | 56,509 | 7,210 | 16,608 | 23,818 |
| මොණරාගල | 28,509 | 3,647 | 9,460 | 13,107 |
| නුවරඑළිය | 25,907 | 2,989 | 10,094 | 13,083 |
| පොළොන්නරුව | 33,500 | 3,849 | 10,919 | 14,768 |
| පුත්තලම | 27,857 | 4,803 | 15,044 | 19,847 |
| රත්නපුර | 44,604 | 4,952 | 14,612 | 19,564 |
| ත්‍රිකුණාමලය | 28,266 | 4,252 | 7,800 | 12,052 |
| වව්නියාව | 8,101 | 1,295 | 2,840 | 4,135 |
| මුලතිව් | 6,825 | 866 | 1,724 | 2,590 |
| **එකතුව** | **941,969** | **144,777** | **344,663** | **489,440** |

| පරිවාස ළමා රක්ෂණ මධ්‍යස්ථාන | ප්‍රතිලාභින් සංඛ්‍යාව | වසරකට වෙන් කරනු ලබන ප්‍රමාණය (මෙ.ටො) |
|---|---|---|
| 09 | 23,396 | 6,240 |

| වතු ප්‍රදේශ | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | වසරකට වෙන් කරනු ලබන ප්‍රමාණය (මළු) | | |
|---|---|---|---|---|
| | | මව්වරුන්ට | ළමයින්ට | එකතුව |
| හැටන් | 10,335 | 2,058 | 4,191 | 6,249 |
| මාතලේ | 2,843 | 525 | 1,182 | 1,707 |
| කෑගල්ල | 4,287 | 753 | 1,818 | 2,571 |
| මහනුවර | 5,324 | 993 | 2,202 | 3,195 |
| කළුතර | 2,469 | 474 | 1,008 | 1,482 |
| නුවර එළිය | 11,510 | 2,250 | 4,656 | 6,906 |
| මාතර | 1,042 | 201 | 423 | 624 |
| බදුල්ල | 10,685 | 2,121 | 4,290 | 6,411 |
| ගාල්ල | 1,070 | 198 | 441 | 639 |
| රත්නපුර | 4,728 | 903 | 1,932 | 2,835 |
| **එකතුව** | **54,293** | **10,476** | **22,143** | **32,619** |

## 2017 වර්ෂයේ ත්‍රිපෝෂ බෙදාහැරීමේ මධ්‍යස්ථාන සංඛ්‍යාව හා ප්‍රතිලාභීන් සංඛ්‍යාව

| | මධ්‍යස්ථාන සංඛ්‍යාව | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|
| ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කොට්ඨාස 26 වෙනුවෙන් | 740 | 941,969 |
| වතු | 447 | 54,293 |
| පරිවාස හා ළමාරක්ෂණ දෙපාර්තමේන්තුවේ ළමා නිවාස | 09 | 23,396 |
| **එකතුව** | **1,196** | **1,019,658** |

# අලෙවි අංශය

## 01. අලෙවි අංශයේ ආරම්භය

“රාජ්‍ය ප්‍රතිපත්තියට අනුකුල වන වෙනත් අනුමත පෝෂ්‍ය පදාර්ථයන් නිපදවීම සහ අලෙවිකරණය“ ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම පිහිටු වීමේ තවත් එක් පරමාර්ථයකි. මෙම පරමාර්ථය යථාර්තයක් කරමින් 2016 වර්ෂයේ දී නව යන්ත්‍ර සූත්‍ර ස්ථාපිත කිරීම නිසා නිපදවන ලද අතිරික්ත ත්‍රිපෝෂ නිෂ්පාදනය “සුපෝෂ“ නමින් වෙළඳපොලට හඳුන්වාදීමට 2017 වර්ෂයේදී කටයුතු කරන ලදි.

## 02. අලෙවි අංශය ආරම්භ කිරීමේ අරමුන

රාජ්‍ය ආයතන යනු අලාභ ලබන ආයතනය යන මිත්‍යා මතයට අභියෝග කරමින් රජයට බරක් නොවන රජය මත යැපෙන ආයතනයක් නොවී ස්වාධිනව උපයාගත් ආදායම මත යැපෙන ලාභ ලබන රාජ්‍ය ආයතනයක් වීම.

## 03. අලෙවි අංශයේ විකාශනය


මෙම සුපෝෂ නිෂ්පාදනය ග්‍රෑම් 100, ග්‍රෑම් 250, ග්‍රෑම් 500 සහ ග්‍රෑම් 750 යන බාණ්ඩ 04 යටතේ අලෙවි නියෝජිතයින් 06 දෙනෙකු මගින් මහනුවර, කළුතර සහ ගාල්ල යන දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි මුලින්ම වෙළඳපොළට හඳුන්වාදෙන ලදි.

2017 වර්ෂය අවසන් වන විට 25 දෙනෙකුගෙන් සමන් විත අලෙවි නියෝජිත ජාලයක් මගින් දිවයිනේ දිස්ත්‍රික්ක 11ක් ආවරණය කිරීමට හැකි වී ඇත. මීට අමතරව ත්‍රිපෝෂ සමාගම් පරිශ්‍රය තුල සුපෝෂ සහ හයිලන්ඩ් නිෂ්පාදන අලෙවි කිරීම සඳහා අලෙවි කුටියක්ද විවෘත කරන ලදිග

සුපෝෂ නිෂ්පාදනය හඳුන්වාදුන් 2017 වර්ෂයේ අවසන් කාර්තු තුනේදි අලෙවි ආදායම රු මිලියන 255 ඉක්මවා යාමට හැකි වූ අතර එමගින් රු මිලියන 80ක ලාභයක් ලබාගැනිමට හැකි විය.

මෙම උපයාගත් ලාභයෙන් රු 4,240,000/- ක පිරිවැයක් දරා ත්‍රිපෝෂ සහ සුපෝෂ ප්‍රවාහනය සඳහා නව ලොරි රථයක් මිලදි ගන්නා ලදි.

## 2017 වර්ෂයේ සුපෝෂ අලෙවි ආදායම (රු 000)




## 04. මුහුන දිමට සිදුවි ඇති අභියෝග සහ තර්ජන

**01.** ඉතා දිගු කාලයක් කේෂ්ත්‍රයේ රැදි සිටිමින් සන්නාමයන් සහිතව වෙළද පොළ තුල ඒකාධිකාරයක් ස්ථාපිත කරගෙන ඇති ආයතන සමග තරගකාරිත්වයට මුහුන දිමට සිදු විම. නමුත් ඉහල තරගකාරිත්වය හමුවේ ත්‍රිපෝෂ සන්නාමය සමග සුපෝෂ ප්‍රචාරන කටයුතු සිදු කිරිම නිසා වෙළද පොළ සහ පාරිභෝගිකයා රදවා තබාගැනිමට හැකිවේ.

**02.** මෙම කර්මාන්තයේ ඇති මහා පරිමාන ආයතන විවිධ ප්‍රචාරන මාධ්‍යයන් යොදා ගනිමින් තම නිෂ්පාදනයන් සදහා ඉහල ප්‍රචාරනයක් ලබාදිම


**03.** ඉල්ලුමට සරිලන සැපයුමක් ලබාදිමට නොහැකි විම

## 05. අලෙවි අංශයේ අපේක්ෂිත ඉලක්ක ජ 2018

01. අලෙවි ආදායම රු මිලියන 450 දක්වා වැඩිකර ගැනිම සහ මෙය වාර්ෂිකව 20% කින් ඉහල නැංවිම. 2018 වර්ෂයේ සැප්තැම්බර් මාසය වන විටත් අලෙවි ආදායම රු මිලියන 382 සීමාව ඉක්මවා යාමට හැකි වි ඇත.

02. දිවයිනේ දිස්ත්‍රික්ක 24 ක් ආවරණය වන පරිදි අලෙවි නියෝජිත ජාලය 42ක් දක්වා වැඩි කිරිම

## දිවයිනේ ආවරණය වන ප්‍රදේශ



## අවසන් ඉලක්කය

රජයට බරක් නොවන රජය මත යැපෙන ආයතනයක් නොව් ස්වාධීනව උපයාගත් ආදායම මත යැපෙන රාජ්‍ය ආයතනයක් වීම අපගේ අවසන් ඉලක්කය වේ.

## 2017 වර්ෂය තුළ අත්කරගත් ජයග්‍රහණ සහ 2018 වර්ෂයේ සාර්ථකත්වය වෙනුවෙන් යෝජනා

### 2017 වසරේ අප ලද ජයග්‍රහන

01. 2017 වර්ෂයේදි ත්‍රිපෝෂ අතිරික්ත නිෂ්පාදනය සුපෝෂ නමින් අලෙවි නියෝජිත ජාලයක් මගින් වෙළඳ පොළට හඳුන්වාදිම

02. සුපෝෂ සහ හයිලන්ඩ් නිෂ්පාදන අලෙවි කිරිම සඳහා ත්‍රිපෝෂ ආයතනය තුල අලෙවි කුටියක් විවෘත කිරිම

03. 2017 වර්ෂයේ අවසන් කාර්තු තුන තුලදි සුපෝෂ අලෙවියෙන් රු මිලියන 232ක ආදායමක් උපයා ඇති අතර එමගින් රජයට රු.මිලියන 157ක මුදලක් ලබාදි ඇත. මෙමගින් රු මිලියන 80ක ලාභයක් ඉපයීමටද සමත් විය

04. ත්‍රිපෝෂ සහ සුපෝෂ බෙදාහැරීම කාර්යක්ෂම කිරිම සඳහා නව ලොරි රථයක් මිලදි ගැනිම

### 2018 වර්ෂයේ සාර්ථකත්වය වෙනුවෙන් යෝජනා

1. පාරිභෝගික අවශ්‍යතාවය 100% සම්පුර්ණ කිරීමට නිෂ්පාදනය සඳහා අවශ්‍යය අමුද්‍රව්‍ය මිලදි ගැනිම.

2. නව නිෂ්පාදනයත් සමග අවශ්‍ය කරන ගබඩා පහසුකම් වැඩි දියුණු කිරිම. මේ සඳහා විශාල ප්‍රමානයේ සයිලෝ එකක් ඉදිකිරිම.

3. ත්‍රිපෝෂ සමාගම සඳහා වාර්ෂික අයවැයෙන් වෙන්කරනු ලබන ප්‍රතිපාදන වැඩි කිරිම.

4. ත්‍රිපෝෂ ආශ්‍රිත නව නිෂ්පාදන වෙළඳ පොළට හඳුන්වාදිම.

5. අලෙවි ප්‍රවර්ධන වැඩ සටහන් මගින් සුපෝෂ නව නිෂ්පාදනය පාරිභෝගිකයින් අතර වඩාත් ප්‍රචලිත කිරිම.

6. අළෙවි නියෝජිත ජාලය මුළු දිවයිනම ආවරණය වන පරිදි වඩාත් පුළුල් කිරිම.

7. බෙදාහැරීමේ කටයුතු විදිමත් හා කාර්යක්ෂම කිරිම සඳහා නව ලොරි රථයක් මිලදි ගැනිම.

# ස්තුතිය

අප දිරිමත් කරමින් නිරතුරු අපට මාර්ගෝපදේශකත්වය ලබා දුන් සෞඛ්‍ය අමාත්‍ය ගරු වෛද්‍ය රාජිත සේනාරත්න මැතිතුමාට, අපට නිරතුරු අවශ්‍ය සහය ලබා දුන් නියෝජ්‍ය සෞඛ්‍ය අමාත්‍ය ගරු ෆයිසල් කසිම් මැතිතුමාට, අප නිසි මගට යොමු කරමින් උපදෙස් ලබා දුන් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් ගරු ජනක සුගතදාස මැතිතුමාට සහ අපට වාර්ෂිකව අවශ්‍ය ප්‍රතිපාදන ලබා දෙමින් අතහිත දුන් මුදල් අමාත්‍යාංශයේ ලේකම් හා මහා භාණ්ඩාගාරයේ ලේකම් ගරු ආර්. එච්. එස්. සමරතුංග මැතිතුමාට අපගේ ස්තුතිය පුදකර සිටිමු.

එලෙසින්ම ආයතනයේ කළමනාකාරීත්වය දරමින් අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලුම මහත්ම, මහත්මීන්ගෙන් ලද සහාය අප සැමට ආශිර්වාදයක්ම විය. එමෙන්ම අපගේ සැපයුම්කරුවන් හා බාහිරව අපට සේවය සලසන සැම කෘතඥ පූර්වකව සිහිපත් කරමු.

අපගේ ආයතනයේ ඉහළ සිට පහළටත්, පහළ සිට ඉහළටත් ගලා යන ධුරාවලින් තෘප්තිමත්ව සේවය කරන කාර්ය මණ්ඩලයක් දක්නට ලැබීම ඉමහත් සතුටකි. ආයතනයේ දියුණුවට ඔවුන් ලබා දෙන දායකත්වය අගය කළ යුතුය. අවසන් වශයෙන් මෙම ඉලක්ක ජය ගැනිමට නිරතුරු වෙහෙසෙන ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ සමස්ත කාර්ය මණ්ඩලයට ජයග්‍රහණයේ ප්‍රණාමය පුදකර සිටිමු.

## ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්
## ආදායම් හා වියදම් ප්‍රකාශය
### 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | සටහන් | 2017/12/31 රු. ශත. | 2016/12/31 රු. |
|---|---|---|---|
| **ආදායම** | | | |
| ආදායම | **02** | **2,183,706,297.44** | 1,469,302,573 |
| අඩු කළා : පරිභෝජනයට සුදානම් නිෂ්පාදනවල පිරිවැය | **03** | **(1,904,609,041.44)** | (1,399,905,319) |
| : විකුණුම් පිරිවැය | **04** | **(168,059,812.46)** | - |
| | | **111,037,443.54** | 69,397,254 |
| **වෙනත් ආදායම්** | **05** | **28,982,330.70** | 19,710,673 |
| අඩු කළා : පිරිවැය | | | |
| විකුණුම් හා බෙදාහැරීමේ පිරිවැය | **06** | **21,413,624.52** | 7,046,314 |
| පරිපාලන වියදම් | **07** | **54,560,274.05** | 35,352,121 |
| මූල්‍ය සහ වෙනත් වියදම් | **08** | **195,624.13** | 225,860 |
| | | **76,169,522.70** | 42,624,295 |
| වර්ෂය සඳහා වියදම ඉක්මවූ ආදායම | | **63,850,251.54** | 46,483,631 |

මෙම මූල්‍ය ප්‍රකාශයන්හි ඉතා වැදගත් කොටසක් වන පිටු අංක 7 සිට 23 දක්වා පිටුවල දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති හා මූල්‍ය ප්‍රකාශ සඳහා සිදු කරන ලද සටහන් හා එක්ව ඉහත සඳහන් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය කියවනු ලැබිය යුතුය.

## ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්
## මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය
## 2017 දෙසැම්බර් 31 දිනට

| | සටහන් | 2017/12/31 රු. ශත. | 2016/12/31 රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ | 11 | 669,513,545.57 | 667,194,699 |
| අස්පෘශ්‍ය වත්කම් | 12 | 330,593.79 | 495,891 |
| | | 669,844,139.36 | 667,690,590 |
| ආයෝජන | 13 | 140,763,481.59 | 92,641,170 |
| **ජංගම වත්කම්** | | | |
| වට්ටෝරු භාණ්ඩ | 14 | 200,083,240.79 | 206,108,079 |
| වෙළඳ සහ වෙනත් ලැබීම් | 15 | 149,350,592.89 | 75,520,501 |
| මුදල් හා මුදල් සමාන දෑ | 16 | 59,452,819.37 | 12,310,647 |
| | | 408,886,653.05 | 293,939,227 |
| **මුළු වත්කම්** | | 1,219,494,274.00 | 1,054,270,986 |
| **කොටස් හිමිකම් හා බැරකම්** | | | |
| **ප්‍රාග්ධනය හා සංචිත** | | | |
| ප්‍රාග්ධන සංචිත | 18 | 395,491,067.00 | 380,421,185 |
| ප්‍රත්‍යාගණන සංචිත | 19 | 306,378,657.65 | 307,170,028 |
| වියදම ඉක්මවූ සමුච්චිත ආදායම | | 343,665,512.04 | 307,683,545 |
| **මුළු කොටස් හිමිකම්** | | 1,045,535,236.69 | 995,274,757 |
| **ජංගම නොවන බැරකම්** | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් | 20 | 42,956,779.00 | 37,858,776 |
| වෛද්‍යාධාර අරමුදල | 21 | 176,422.35 | 238,679 |
| | | 43,133,201.35 | 38,097,454 |
| **ජංගම බැරකම්** | | | |
| වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ | 22 | 130,825,835.96 | 20,898,774 |
| **මුළු කොටස් හිමිකම් හා බැරකම්** | | 1,219,494,274.00 | 1,054,270,986 |
| | | - | - |

මෙම මූල්‍ය ප්‍රකාශයන්හි ඉතා වැදගත් කොටසක් වන පිටු අංක 7 සිට 23 දක්වා පිටුවල දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති හා මූල්‍ය ප්‍රකාශන සඳහා සිදු කරන ලද සටහන් හා එක්ව ඉහත සඳහන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය කියවනු ලැබිය යුතුය.

මෙම මූල්‍ය ප්‍රකාශ, 2007 අංක 07 දරන සමාගම් පනතේ දක්වා ඇති නියමයන්ට අනුකූලව සකස් කරනු ලැබ ඇත.

........................
මූල්‍ය ප්‍රධානී

මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකිම දැරිය යුතු වන්නේ ය.

**මණ්ඩලය සඳහා සහ වෙනුවෙන් අනුමත කර, අත්සන් තබන ලදී.**

..................... .....................
සභාපති අධ්‍යක්ෂ

**ජා ඇල, කපුවත්ත**

**දිනය : 2018/04/02**

## ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්
## කොටස් හිමිකම් වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය
### 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | සටහන | ප්‍රාග්ධන සංචිත | ප්‍රත්‍යාගණන සංචිත | වියදම ඉක්මවූ සමුච්චිත ආදායම | එකතුව |
|---|---|---|---|---|---|
| | | රු. ශත. | රු. ශත. | රු. ශත. | රු. ශත. |
| 2016.01.01 දිනට ශේෂය | | 307,575,083.53 | 307,170,027.56 | 261,223,489.10 | 875,968,600.19 |
| සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන | | 102,406,369.70 | - | - | 102,406,369.70 |
| ක්ෂය වීම් - සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ප්‍රදානය කරන ලද ප්‍රාග්ධන වත්කම් | | (29,560,267.97) | - | - | (29,560,267.97) |
| පූර්ව වර්ෂයේ ගැළපුම් | | - | - | (23,575.77) | (23,575.77) |
| 2016 වර්ෂයේ වියදම ඉක්මවූ ආදායම | | - | - | 46,483,631.27 | 46,483,631.27 |
| 2016.12.31 දිනට ශේෂය | | **380,421,185.26** | **307,170,027.56** | **307,683,544.60** | **995,274,757.42** |
| 2017.01.01 දිනට ශේෂය | | 380,421,185.26 | 307,170,027.56 | 307,683,544.60 | **995,274,757.42** |
| සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන | **18** | 70,386,741.08 | - | - | **70,386,741.08** |
| ක්ෂය වීම් - සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ප්‍රදානය කරන ලද ප්‍රාග්ධන වත්කම් | **18** | (55,316,859.32) | - | - | **(55,316,859.32)** |
| ව්‍යපහරණ වත්කම් මත ප්‍රත්‍යාගණන ලාභ /අලාභ ප්‍රත්‍යාගණන ලැබීම් / බැහැර කරන ලද වත්කම් | | - | (791,369.91) | | **(791,369.91)** |
| පූර්ව වර්ෂයේ ගැළපුම් - 2017 | **23** | - | - | (27,868,284.10) | **(27,868,284.10)** |
| 2017 වර්ෂයේ වියදම ඉක්මවූ ආදායම | | - | - | 63,850,251.54 | **63,850,251.54** |
| 2017.12.31 දිනට ශේෂය | | **395,491,067.02** | **306,378,657.65** | **343,665,512.04** | **1,045,535,236.71** |

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්
මුදල් ප්‍රවාහ ප්‍රකාශය
2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | 2017/12/31 රු. | 2016/12/31 රු. |
|---|---|---|
| **මෙහෙයුම් කටයුතු වලින් මුදල් ප්‍රවාහ** | | |
| වර්ෂය සඳහා වියදම ඉක්මවූ ආදායම | **63,850,252** | 46,483,631 |
| **ගැළපුම්** | | |
| ක්ෂය වීම් | **56,009,370** | 29,560,268 |
| වර්ෂය සඳහා පාරිතෝෂිත ප්‍රතිපාදන | **9,185,605** | 8,841,796 |
| වෛද්‍යාධාර දායකත්වය සඳහා ප්‍රතිපාදන | **98,600** | 193,600 |
| පූර්ව වර්ෂ ගැළපුම් | **(27,868,284)** | (23,576) |
| | **37,425,291** | 38,572,088 |
| කාරක ප්‍රාග්ධනයේ වෙනස්කම් වලට පෙර මෙහෙයුම් ලාභය | **101,275,542** | 85,055,719 |
| **කාරක ප්‍රාග්ධනයේ සිදුවූ වෙනස්කම්** | | |
| ණය ගැතියෝ සහ වෙනත් ලැබීම් නියමිත වල වැඩිවීම / (අඩුවීම) | **(73,830,092)** | 59,026,630 |
| වෙළඳ හා වෙනත් ගෙවීම් නියමිත වල වැඩිවීම / (අඩුවීම) | **109,927,062** | (16,871,644) |
| වට්ටෝරු භාණ්ඩ වැඩිවීම / (අඩුවීම) | **6,024,838** | 22,165,039 |
| | **42,121,807** | 64,320,025 |
| පාරිතොෂික ගෙවීමට පෙර මෙහෙයුම් කටයුතු වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ | **143,397,349** | 149,375,744 |
| **අඩු කළා : ගෙවන ලද පාරිතෝෂිත** | **(4,087,601)** | (576,705) |
| වෛද්‍ය ප්‍රතිලාභ ගෙවීම් | **(160,857)** | (196,411) |
| මෙහෙයුම් කටයුතු වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ | **139,148,892** | 148,602,628 |
| **ආයෝජන කටයුතු වලින් මුදල් ප්‍රවාහ** | | |
| දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ අත්කර ගැනීම | **(60,150,025)** | (260,671,636) |
| ස්ථාවර තැන්පතු අත්කර ගැනීම | **(46,400,000)** | - |
| පොලී ආදායම | **(526,577)** | (2,389,439) |
| ආයෝජන කටයුතුවලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ | **(107,076,602)** | (263,061,075) |
| **මූල්‍ය කටයුතුවලින් මුදල් ප්‍රවාහ** | | |
| සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන | **15,069,882** | 72,846,102 |
| මූල්‍ය කටයුතු වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ | **15,069,882** | 72,846,102 |
| මුදල් හා මුදල් සමාන දෑ වෙනස්වීම් | **47,142,172** | (41,612,345) |
| මුදල් හා මුදල් සමාන දෑ ඉදිරියට ගෙන එන ලදී | **12,310,647** | 53,922,992 |
| මුදල් හා මුදල් සමාන දෑ ඉදිරියට ගෙන යන ලදී | **59,452,819** | 12,310,647 |

**මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයෙහි දක්වා ඇති මුදල් සහ මුදල් සමාන දෑ හි විශ්ලේෂණය**

| | | |
|---|---|---|
| ලංකා බැංකුව, ජා-ඇල 71324617 | **13,530,026** | 12,310,647 |
| ලංකා බැංකුව, ජා-ඇල ගිණුම් අංක 80306903 | **45,902,793** | - |
| සුළු මුදල් | **20,000** | - |
| | **59,452,819** | 12,310,647 |

## ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්
## නිෂ්පාදන ගිණුම
### 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | සටහන | 2017/12/31 රු. ශත. | 2016/12/31 රු. |
|---|---|---|---|
| **නිෂ්පාදන පිරිවැය** | | | |
| **අමු ද්‍රව්‍ය හා ඇසුරුම් ද්‍රව්‍ය** | | | |
| 2017.01.01 දිනට ශේෂය | | **151,509,362.88** | 169,087,068 |
| මිලදී ගැනීම් | | **1,564,586,323.58** | 1,156,412,061 |
| | | **1,716,095,686.46** | 1,325,499,129 |
| 2017.12.31 දිනට ශේෂය | **14** | **(146,784,459.46)** | (151,509,363) |
| පරිභෝජනය කළ අමුද්‍රව්‍යවල පිරිවැය | | **1,569,244,940.13** | 1,173,989,766 |
| සෘජු ශ්‍රම පිරිවැය හා කළමනාකරණ පිරිවැය | **09** | **178,601,881.46** | 135,324,941 |
| කම්හල් පොදුකාර්ය වියදම් | **10** | **141,801,206.17** | 85,827,670 |
| ප්‍රති සැකසුම් අලාභය | | **(2,355.61)** | (199,119) |
| මූලික පිරිවැය | | **1,889,645,672.15** | 1,394,943,258 |
| **නොනිමි** | | | |
| 2017.01.01 දිනට ශේෂය | | **8,215,483.81** | 9,025,426 |
| 2017.12.31 දිනට ශේෂය | **14** | **(2,388,929.16)** | (8,215,484) |
| | | **5,826,554.65** | 809,942 |
| මුලු නිෂ්පාදන පිරිවැය | | **1,895,472,226.80** | 1,395,753,200 |

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්

"සුපෝෂ"

ආදායම් හා වියදම් ප්‍රකාශය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | 2017/12/31 |
|---|---|
| | රු. ශත. |
| **ආදායම** | |
| ආදායම | 255,227,931.86 |
| අඩු කළා : විකුණුම් පිරිවැය | (168,059,812.46) |
| | **87,168,119.40** |
| **වෙනත් ආදායම්** | 1,411,832.62 |
| **වියදම්** | |
| විකුණුම් හා බෙදාහැරීමේ පිරිවැය | 5,706,166.37 |
| පරිපාලන වියදම් | 2,508,561.90 |
| මූල්‍ය සහ වෙනත් වියදම් | 274,328.30 |
| | 8,489,056.57 |
| 2017 වර්ෂය සඳහා වියදම ඉක්මවූ ආදායම | **80,090,895.45** |

## 1. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 1.1.1 වාර්තා කිරීමේ ආයතනය

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්, පූර්ණ රජය සතු සමාගමක් ලෙස ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත කර පිහිටුවා ඇති, සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන සීමිත වගකීමක් සහිත සමාගමකි. සමාගමේ ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය ශ්‍රී ලංකාව, ජා ඇල, කපුවත්ත, තැ.පෙ. අංක 17 හි පිහිටා ඇත.

### 1.1.2 ප්‍රධාන කටයුතු සහ මෙහෙයුම්වල ස්වභාවය

සෞඛ්‍ය අමාත්‍යාංශයේ "ත්‍රිපෝෂ බෙදාහැරීමේ වැඩසටහන" සඳහා "ත්‍රිපෝෂ" නිෂ්පාදනය කරනු ලබන එකම සමාගම වනුයේ මෙම සමාගමයි.

සමාගමේ වෙනත් ප්‍රධාන කාර්යයන් වූයේ :

- ශ්‍රී ලංකාව තුළ මාතෘ සහ ළමා මන්දපෝෂණය අඩු කිරීම සඳහා ශක්ති වර්ධක ශ්‍රී ලාංකික අතිරේක ආහාර නිෂ්පාදිතයක් වන "ත්‍රිපෝෂ" වැඩි දියුණු කිරීම, නිෂ්පාදනය සහ බෙදා හැරීම පිණිස පහසුකම් සැලසීම.
- ත්‍රිපෝෂ නිෂ්පාදනය සඳහා අමු ද්‍රව්‍ය සපයනු ලබන දේශීය ගොවින් වෙත හැකි තාක් දුරට ආදායම් ජනනය වන මාර්ග සඳහා ධෛර්යමත් කිරීම.
- රජයේ ප්‍රතිපත්තිය මත පදනම්ව, වෙනත් ආකාරයේ ශක්තිවර්ධක මිශ්‍ර කරන ලද ආහාර ද්‍රව්‍ය සඳහා පවතින වෙළඳපොළ අවම කිරීම.
- වාර්ෂික ත්‍රිපෝෂ අවශ්‍යතාව පිළිබඳව ඇගයීමක් සිදු කර, එය සැපයීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

### 1.1.3 අධ්‍යක්ෂ මණ්ඩලය

1. එම්. ඩී. බන්දුසේන මහතා (සභාපති)
2. වෛද්‍ය ජේ. එම්. ඩබ්ලිව්. ජයසුන්දර බණ්ඩාර මහතා
3. වෛද්‍ය ශාන්ති ගුණවර්ධන මහත්මිය
4. එච්. එම්. තේජා හේරත් මහත්මිය
5. එච්. එම්. චමින්දිකා හේරත් මෙනවිය
6. වෛද්‍ය දමයන්ති හපුගොඩ මහත්මිය
7. ඩබ්ලිව්. පී. සෙව්වන්දි මහත්මිය
8. එස්. ආර්. රාජපක්ෂ මහතා (නිරීක්ෂක)

**මණ්ඩලයේ ලේකම්**
තනුජා ප්‍රියදර්ශනී අල්විස් මහත්මිය

### 1.1.4 විගණකවරුන්

විගණකාධිපති දෙපාර්තමේන්තුව
අංක 306/72, පොල්දුව පාර,
බත්තරමුල්ල.

### 1.1.5 බැංකුකරුවන්

ලංකා බැංකුව,
ජා ඇල.

### 1.1.6 නිකුත් කිරීම සඳහා බලයලත් දිනය

අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනාවට අනුව, 2017 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්හි මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීම පිණිස අවසර ලබා දෙන ලදී.

**1.1.7 සකස් කිරීමේ පදනම**

**අ. අනුකූලතාව දැක්වීමේ ප්‍රකාශය**

ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් (මූල්‍ය ප්‍රකාශන) සමඟ ආදායම් ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් හා වියදම් ප්‍රකාශය, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය සහ සම කොටස්හි වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය සකස් කරනු ලැබ ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී වරුන්ගේ සංගමය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව සහ 2007 අංක 7 දරන සමාගම් පනතෙහි දක්වා ඇති අවශ්‍යතාවලට අනුකූලවය.

**ආ. නිර්ණය කිරීමේ පදනම**

අදාළ සටහන් යටතේ සාධාරණ වටිනාකම සම්බන්ධයෙන් යෝග්‍ය අනාවරණය කිරීම් සිදු කරනු ලබන අවස්ථාවන්හිදී හැර, මෙම මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කරනු ලැබ ඇත.

**ඇ. සංසන්දනාත්මක තොරතුරු**

වර්තමාන කාල සීමාව තුළ මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අවබෝධය වැඩි දියුණු කිරීමේ සහ අන්තර් කාල සීමා තුලනාත්මකභාවය ඉහළ නැංවීමේ අරමුණින්, එම මූල්‍ය ප්‍රකාශවල වාර්තා කර ඇති පෙර වර්ෂයේ සියලුම වටිනාකම් සම්බන්ධයෙන් ගුණාත්මක, විස්තරාත්මක සහ ව්‍යක්ත තොරතුරු ඇතුලත් සංසන්දනාත්මක තොරතුරු අනාවරණය කරනු ලැබේ.

පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති, වෙනත් යම් අයුරකින් දක්වා ඇති අවස්ථාවකදී හැරුණු කොට, මෙම මූල්‍ය ප්‍රකාශවල ඉදිරිපත් කර ඇති සියලුම කාල සීමාවන් සඳහා අඛණ්ඩව අදාළ කරගනු ලැබ ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශවල අන්තර්ගත විෂයයන්හි ඉදිරිපත් කිරීම හෝ වර්ගීකරණය කිරීම සංශෝධනය කරනු ලැබ ඇති අවස්ථාවකදී, මනා ඉදිරිපත් කිරීමක් සිදු කිරීම පිණිස වත්මන් වර්ෂය හා අනුකූල වීම සඳහා සංසන්දනාත්මක වටිනාකම් ද නැවත වර්ගීකරණයට ලක් කරනු ලැබ ඇත.

**ඈ. ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ වලංගු මුදල**

සමාගමේ ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ වලංගු මුදල වන ශ්‍රී ලංකා රුපියල් වලින් මෙම මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරනු ලැබේ.

වෙනත් යම් අයුරකින් දක්වා ඇති අවස්ථාවකදී හැරුණු කොට, ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති සියලුම මූල්‍ය තොරතුරු ආසන්න දහසට වටයනු ලැබ ඇත.

**ඉ. ප්‍රධාන ඇස්තමේන්තු සහ වැදගත් තීන්දු භාවිත කිරීම**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනුගත වූ මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම හා ඉදිරිපත් කිරීම මගින් කළමනාකරණය විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් හි ගිණුම්කරණ ප්‍රතිපත්ති වල භාවිතය හා වාර්තාගත වටිනාකම් කෙරෙහි බලපෑම් ඇති කරනු ලබන ස්වරූපයේ තීන්දු ගැනීම, ඇස්තමේන්තු සකස් කිරීම සහ පූර්ව නිගමන වලට එළඹීම අපේක්ෂා කෙරේ. තථ්‍ය ප්‍රතිඵල, මෙම ඇස්තමේන්තු වලින් සහ යොදා ගන්නා ලද නිගමන වලින් වෙනස් විය හැකි ය.

ඇස්තමේන්තු සහ පාදක කර ගත් පූර්ව නිගමන අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කරනු ලැබේ. ඇස්තමේන්තුව සංශෝධනය කරනු ලබන කාල සීමාව තුළ ගිණුම්කරණ ඇස්තමේන්තු වලට සිදු කරනු ලබන සංශෝධන හඳුනා ගනු ලබන්නේ, එම සංශෝධනය එම කාල සීමාව සඳහා පමණක් බලපාන්නේ නම් හෝ එකී සංශෝධනය වර්තමාන සහ අනාගත කාල සීමා දෙකටම බලපාන්නේ නම්, එම සංශෝධන කාල සීමාව සහ අනාගත කාල සීමාවන් තුළදී ය.

**ඊ. ක්‍රියාත්මක ව්‍යාපාර තත්වය**

නුදුරු අනාගත කාලය තුළ ක්‍රියාත්මක ව්‍යාපාරයක් වශයෙන් සමාගම නොකඩවා පවත්වාගෙන යාමට ඊට ඇති හැකියාව සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය තක්සේරුවක් කර ඇති අතර ස්වකීය මෙහෙයුම් කටයුතු අඛණ්ඩව සිදුකරගෙන යාමට අවශ්‍ය තරම් ප්‍රමාණවත් සම්පත් සමාගම සතුව පවතින බවට මණ්ඩලය සෑහීමට පත් වෙමින්, ඒ අනුව, සමාගම ක්‍රියාත්මක තත්වයේ පවත්වාගෙන යාමේ උපකල්පනය නුදුරු අනාගත කාල සීමාව තුළ නොකඩවා යොදාගත හැකි බවට ද සහතික වෙයි.

## 1.2 වත්කම් සහ එම වත්කම් තක්සේරු කිරීමේ පදනම්

### 1.2.1 දේපළ, පිඨයත සහ යන්ත්‍රෝපකරණ

#### අ. හඳුනා ගැනීම සහ ඇගයීම

දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ විෂයයන් පිරිවැය යටතේ හෝ සමුච්චිත ක්ෂය වීම් අඩු කරන ලද සාධාරණ අගය යටතේ සහ වෙනත් යම් දුබලතා අලාභ යටතේ දක්වා ඇත.

සියලුම දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ විෂයයන් මූලික වශයෙන් පිරිවැය යටතේ හෝ සමුච්චිත ක්ෂය වීම් අඩු කරන ලද පිරිවැය යටතේ සහ යම් දුබලතා අලාභ යටතේ වාර්තා කර ඇත. වත්කමක වැදගත් අංග හඳුනා ගෙන, වෙන වෙනම ක්ෂය කිරීම් සිදු කරනු ලැබේ. දේපල, යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණවල වැදගත් අංග අන්තර් කාලය තුළ ආදේශ කරනු ලැබීමට අවශ්‍ය වන්නේ නම්, ආයතනය විසින් එම ආදේශ කළ කොටස බැහැර කරන අතර, නව කොටසෙහිම ප්‍රයෝජ්‍ය ජීව කාලය සහ ක්ෂය වීම් සමඟ එම කොටස හඳුනා ගනු ලැබේ. අනෙකුත් සියලුම අළුත්වැඩියා කිරීමේ හා නඩත්තු කිරීමේ පිරිවැය පැන නඟිනු ලබන පරිදි, ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ.

#### ආ. පිරිවැය

දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණවල පිරිවැය, ඒවා මිලදී ගත් මිල සහ එයින් අපේක්ෂිත කාර්යය උදෙසා එම වත්කම ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒම පිණිස ඍජුවම දරන ලද වෙනත් පිරිවැයෙන් සමන්විත වේ.

ඉපැයීමේ ධාරිතාව පවත්වාගෙන යාමේ හෝ ඉහළ නැංවීමේ අරමුණින්, ස්ථිර ස්වරූපයේ වත්කම් අත්පත් කර ගැනීම, දීර්ඝ කිරීම හෝ වැඩි දියුණු කිරීම සඳහා දරනු ලබන පසු කාලීන වියදම්, ප්‍රාග්ධන වියදම් සේ සලකනු ලැබ ඇත.

ප්‍රධාන පරීක්ෂා කිරීම් සහ පරීක්ෂා කිරීමේ වියදම් ඇතුලත්, වෙන් වෙන් වශයෙන් ගිණුම්ගත කරනු ලබන දේපළක, පිරියතක සහ යන්ත්‍රෝපකරණයක එක් අංගයක් ආදේශ කිරීම සඳහා දරනු ලබන වියදම, ප්‍රාග්ධනීකරණය කරනු ලැබේ. වෙනත් පසුකාලීන වියදම් ප්‍රාග්ධනීකරණය කරනු ලබන්නේ, එම අංගයේ ඇතුලත් ඉදිරි ආර්ථික ප්‍රතිලාභ සමාගම වෙත ගලා ඒමේ හැකියාවක් පවතී නම් සහ එහි පිරිවැය යථාර්ථවාදී ලෙස ගණනය කළ හැකි නම් පමණි.

#### ඇ. ක්ෂය කිරීම්

වත්කම්හි ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ජීව කාලය මත එම වත්කම්හි පිරිවැය ඉවත් කිරීම පිණිස, පහත සඳහන් වටිනාකම් යටතේ ඍජු රේඛීය පදනම (straight-line basis) මත වාර්ෂිකව, ප්‍රාග්ධන සංචිතය වෙත ක්ෂය කිරීම් සිදු කරනු ලැබේ.

| | |
|---|---|
| ගොඩනැගිලි | අවුරුදු 20 ට වැඩි |
| පිරියත සහ යන්ත්‍රෝපකරණ | අවුරුදු 10 ට වැඩි |
| මෝටර් රථ | අවුරුදු 05 ට වැඩි |
| යන්ත්‍රෝපකරණ හා උපකරණ | අවුරුදු 05 ට වැඩි |
| විද්‍යාගාර උපකරණ | අවුරුදු 10 ට වැඩි |
| කෘෂිකාර්මික උපකරණ | අවුරුදු 10 ට වැඩි |
| විදුලි වැඩ | අවුරුදු 05 ට වැඩි |
| කාර්යාල උපකරණ | අවුරුදු 10 ට වැඩි |
| ලී බඩු සහ සවි කිරීම් | අවුරුදු 10 ට වැඩි |
| අස්පෘශ්‍ය වත්කම් | අවුරුදු 04 ට වැඩි |

#### ඈ. හඳුනා නොගැනීම

බැහැර කරන විටදී හෝ භාවිතයෙන් කිසිදු ඉදිරි ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂා නොකරනු ලබන අවස්ථාවකදී, දේපළක, පිරියතක සහ යන්ත්‍රෝපකරණයක අංගයක් හඳුනා නොගනු ලැබූ සේ සැලකේ. වත්කම් හඳුනා නොගැනීම මත හිමි වන ඕනෑම ලාභයක් හෝ පාඩුවක්, එම හඳුනා නොගැනීම සිදු කරනු ලබන වර්ෂයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ ඇතුලත් කරනු ලැබේ.

### 1.2.2 නිම නොවූ වැඩ

භාවිතයේ පවතින ප්‍රාග්ධනය පිරිවැයෙහි දක්වනු ලැබේ. මෙම වියදම්, ප්‍රාග්ධනීකරණය වීමට ඇති ගොඩනැගිලි ඉදි කිරීමේදී ඍජුවම භට ගන්නා ප්‍රාග්ධන ස්වරූපයක වියදම් වේ. භාවිතයේ පවතින ප්‍රාග්ධනය, භාවිතය සඳහා ලබා ගත හැකි අවස්ථාවේදී, අදාළ දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ වත්කම් වර්ගීකරණයට මාරු කරනු ලැබේ. එනම්, සමාගම විසින් අපේක්ෂිත අයුරින් ඒ සඳහා ක්‍රියාත්මක වීමට හැකි ආකාරයෙන් එය පිහිටා ඇති අවස්ථාවේදී සහ අවශ්‍ය තත්ත්වයෙන් පවතින අවස්ථාවේදී ය. කෙරෙමින් පවතින ප්‍රාග්ධන වැඩ, යම් සමුච්චිත දුබලතා අලාභ අඩු කළ ණය ගැනුම් පිරිවැය ඇතුළත්ව, ගත් මිලට දක්වනු ලැබේ.

**1.2.3 අස්පෘශ්‍ය වත්කම්**

වත්කම වෙත ලැබෙන ඉදිරි ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ගලා ඒමේ සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 38 අස්පෘශ්‍ය වත්කම්හි පරිදි වත්කමෙහි පිරිවැය යථාර්ථවාදී ලෙස ඇගයීමේ හැකියාවක් පවතී නම්, එය අස්පෘශ්‍ය වත්කමක් ලෙස හඳුනා ගනු ලැබේ. ඒ අනුව, මෙම වත්කම්, සමුච්චිත ක්‍රමක්ෂය සහ යම් සමුච්චිත දුබලතා අලාභ අඩු කළ ගත් මිලට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි සඳහන් කරනු ලැබේ.

පරිගණක මෘදුකාංග වර්ෂ 4 ක කාල සීමාවක් පුරා සෘජු රේඛීය ක්‍රමය මත ක්‍රමක්ෂය කර ඇත.
වර්ෂ 5ක කාල සීමාවක් පුරා සෘජු රේඛීය ක්‍රමය මත විෂය මාලා පටිපාටි සංවර්ධනය කිරීමේ පිරිවැය ලියා අස්කර තිබේ.

**1.2.4 භාණ්ඩ ලේඛන**

කල් ඉකුත් වූ සහ අඩු ක්‍රියාකාරී අයිතම සඳහා නිසි ඉඩ ලබා දීමෙන් අනතුරුව, සාමාන්‍ය පිරිවැය යටතේ භාණ්ඩ ලේඛන ඇගයීම පළමුව පැමිණ පළමුව පිටවන පදනම **(FIFO)** මත සිදු කරනු ලැබේ. ලබා ගත හැකි දළ වටිනාකම වනුයේ, සාමාන්‍ය වෙළෙඳපොළ තුළ, භාණ්ඩ ලේඛනය සකස් කිරීම අවසන් වූ පසු ඇස්තමේන්තුගත පිරිවැයට අඩු සහ විකිණීම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය යටතේ වන මිලයි.

භාණ්ඩ ලේඛන වත්මන් ස්ථානයට සහ තත්ත්වයට රැගෙන ඒමේදී දරනු ලබන පිරිවැය, පහත සඳහන් සූත්‍ර භාවිත කරමින් ගිණුම් ගත කරනු ලැබේ : -

| | | |
|---|---|---|
| අමු ද්‍රව්‍ය | - | ගත් මිලට |
| කෙරෙමින් පවතින වැඩ | - | ගත් මිලට |
| නිම කළ භාණ්ඩ සහ | - | සෘජු ද්‍රව්‍ය සහ සෘජු ශ්‍රම පිරිවැය යටතේ සාමාන්‍ය මෙහෙයුම් ධාරිතාව පදනම්ව ස්ථිර නිෂ්පාදිතයේ යෝග්‍ය සමානුපාතිකයක් සඳහා වියදම් වෙන් කිරීම් සිදු කරනු ලබයි. |
| ගෙන යාමට නියමිත භාණ්ඩ | - | තථ්‍ය පිරිවැය යටතේ |

ලබා ගත හැකි දළ වටිනාකම වනුයේ, සාමාන්‍ය වෙළෙඳපොළ තුළ, භාණ්ඩ ලේඛනය සකස් කිරීම අවසන් වූ පසු ඇස්තමේන්තුගත පිරිවැයට අඩු සහ විකිණීම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය යටතේ වන ඇස්තමේන්තු ගත විකුණුම් මිලයි.

**1.2.5 වත්කම් දුබලතාවයට පත්වීම**

දුබලතාවයට පත්වීම පිළිබඳ යම් සඳහනක් වේ දැයි නිර්ණය කිරීම සඳහා සෑම වාර්තා කරනු ලබන දිනකදීම වත්කම්හි ප්‍රවාහන පිරිවැය සමාලෝචනය කරනු ලැබේ. එවැනි සඳහනක් වුවහොත්, නැවත ලබා ගත හැකි වත්කම් ප්‍රමාණය ඇස්තමේන්තු කරනු ලැබේ. දුබලතාවයට අලාභයක් හඳුනා ගනු ලබන්නේ, යම් වත්කමක ප්‍රවාහන පිරිවැය හෝ මුදල් ජනනය කිරීමේ ඒකකය, එහි නැවත ලබා ගත හැකි ප්‍රමාණය ඉක්මවා යන්නේ නම් ය. නැවත ලබා ගත හැකි ප්‍රමාණය නිර්ණය කිරීම සඳහා භාවිත කරන ලද ඇස්තමේන්තුවල වෙනසක් සිදු වී ඇත්නම්, දුබලතා අලාභය නැවත හරවාලනු ලැබේ.

**1.2.6 මූල්‍ය වත්කම්**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39 යටතේ පවත්නා මූල්‍ය වත්කම්, ලාභ හෝ අලාභ, ණය සහ ලැබිය යුතු, කල් පිරීමට නියමිත ආයෝජන, විකිණීමට ඇති මූල්‍ය වත්කම් හරහා සාධාරණ අගයක් යටතේ වන මූල්‍ය වත්කම් ලෙස හෝ යෝග්‍ය පරිදි, ඵලදායි සීමාවක් තුළ සීමා කිරීමේ උපකරණ ලෙස සලකනු ලබන ව්‍යුත්පන්න ලෙස හෝ වර්ගීකරණය කරනු ලැබේ. සමාගම විසින් පළමු අවස්ථාවේදී ම, සිය මූල්‍ය වත්කම් වර්ගීකරණය පිළිබඳව නිර්ණය කරනු ලබයි.

සියලුම මූල්‍ය වත්කම් මූලිකවම සාධාරණ වටිනාකම් අතිරික්තය යටතේ හඳුනා ගනු ලබන්නේ, ගණුදෙණු පිරිවැය සඳහා සෘජුවම බලපෑම් කරනු ලබන, ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයක් යටතේ වත්කම් නොවනු ලබන අවස්ථාවකදී ය.
සමාගම විසින්, ඔවුන් සිය සමාගම ස්ථාපිත කළ දිනයේ සිට ණය, ලැබිය යුතු සහ තැන්පතු හඳුනා ගනු ලැබේ. අනෙකුත් සියලුම මූල්‍ය වත්කම් (ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමක් යටතේ දක්වා ඇති වත්කම් ඇතුලත්ව) මූලිකව හඳුනාගනු ලබන්නේ, වෙළඳ ගිවිසුමෙහි ගිවිසුම්ගත විධිවිධාන සඳහා සමාගම විසින් පාර්ශ්වකරුවකු වනු ලබන වෙළඳ දිනයේදී ය.

වත්කමකින් ලැබෙන මුදල් ප්‍රවාහ සඳහා ගිවිසුම්ගත අයිතීන් කල් ඉකුත් වූ විට, සමාගම විසින් එම මූල්‍ය වත්කම බැහැර කරනු ලබන අතර, එමඟින් මූල්‍ය වත්කම් මත ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලබා ගැනීම උදෙසා, සාරානුකූලව මූල්‍ය වත්කමෙහි සියලුම අවදානම් සහ ප්‍රතිලාභ පවරා දෙනු ලබන ගණුදෙණුවක් හරහා එම අයිතිය මාරු කරනු ලැබේ. සමාගම විසින් ඇති කරනු ලබන හෝ රඳවා තබා ගනු ලබන, පවරන ලද මූල්‍ය වත්කම්හි ඕනෑම පොලියක්, වෙන් වෙන් වශයෙන් වත්කමක් හෝ වගකීමක් සේ හඳුනා ගනු ලැබේ.

මූල්‍ය වත්කම් සහ වගකීම් කපා හැරීමක් වන අතර, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය තුළ එම ශුද්ධ අගය ඉදිරිපත් කරනු ලබන්නේ, එම අගයන් කපා හැරීමට සමාගම සතුව නෛතික අයිතියක් පවතින විට සහ ශුද්ධ පදනමක් මත නිරවුල් කිරීමට හෝ වත්කම අත්පත් කොට ගෙන, ඒ හා සමගාමීව වගකීම නිරවුල් කිරීමට අපේක්ෂා කරන්නේ නම් පමණකි.

සමාගමේ මූල්‍ය වත්කම් තුළ මුදල්, කෙටි කාලීන ආයෝජන, වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ ඇතුලත් වේ.

**අ. ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමක් යටතේ පවතින මූල්‍ය වත්කම්**

ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමක් යටතේ පවතින මූල්‍ය වත්කම් තුළ වෙළඳාම සඳහා දරන ලද මූල්‍ය වත්කම් සහ ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමක් යටතේ මූලික හඳුනා ගැනීම මත වර්ගීකරණයට ලක් කරන ලද මූල්‍ය වත්කම් ඇතුලත් වේ. මූල්‍ය වත්කම් වෙළඳාම සඳහා දරන ලද්දේ යයි වර්ගීකරණය කරනු ලබන්නේ, ආසන්නතම කාල සීමාව තුළදී විකිණීමේ හෝ නැවත මිලදී ගැනීමේ අරමුණින්, එම වත්කම් අත්පත් කරගනු ලබන්නේ නම් ය.

ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමක් යටතේ මූල්‍ය වත්කම්, විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි මූල්‍ය ආදායම හෝ මූල්‍ය වියදම තුළ හඳුනා ගනු ලබන සාධාරණ වටිනාකමෙහි වෙනස්කම් සමඟ සාධාරණ වටිනාකම යටතේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය තුළ දක්වාලනු ලැබේ.

සමාගම විසින් ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමක් යටතේ මූලික හඳුනා ගැනීම මත කිසිදු මූල්‍ය වත්කමක් වර්ගීකරණය කර නොමැත.

**ආ. ණය සහ ලැබිය යුතු දෑ**

ණය සහ ලැබිය යුතු දෑ යනු, ක්‍රියාකාරී වෙළඳපොළක් තුළ මතු කොට දක්වා නොමැති, ස්ථිර හෝ ලැබේ යයි සැලකිය හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. මූලික ඇගයීමෙන් අනතුරුව, හායන අඩු කර ඵලදායී පොලී අනුපාත (EIR) ක්‍රමවේදය භාවිත කරමින්, එවැනි මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැය යටතේ පසුව අගයනු ලැබේ. ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලබන්නේ, අත්පත් කරගැනීම මත ලද වට්ටම් හෝ වාරික සහ ඵලදායී පොලී අනුපාතයෙහි වැදගත් කොටසක් වන ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගැනීමෙනි. ඵලදායී පොලී අනුපාත ක්‍රමක්ෂය විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි සඳහන් මූල්‍ය ආදායම තුළ හඳුනා ගනු ලැබේ. දුබලත්වය හේතුවෙන් පැන නගින අලාභ, මූල්‍ය පිරිවැයෙහි සඳහන් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ.

ලැබිය යුතු වෙළඳ ආදායම්, සේවක ණය, තැන්පතු, අත්තිකාරම්, වෙනත් ලැබිය යුතු සහ මුදල් සහ මුදල් සමාන දෑ ආදියෙන් ණය සහ ලැබිය යුතු ආදායම් සමන්විත වේ.

**ඇ. කල් පිරීමට නියමිත ආයෝජන**

ස්ථිර හෝ නිර්ණය කළ හැකි ගෙවීම් සහ ස්ථිර කල් පිරෙන තැන්පතු හා බැඳි ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්, සමාගම විසින් ධනාත්මක අදහසකින් පසු වන සහ කල් පිරෙන තෙක් ඒවා රඳවා තබා ගැනීමේ හැකියාව සමාගම සතු වූ විට, කල් පිරීමට නියමිත ආයෝජන ලෙස වර්ගීකරණය කරනු ලැබේ. මූලික ඇගයීමෙන් අනතුරුව, දුබලතා ඌණ ඵලදායී පොලී අනුපාත (EIR) ක්‍රමවේදය භාවිත කරමින්, එවැනි කල් පිරීමට නියමිත ආයෝජන ක්‍රමක්ෂය පිරිවැය යටතේ අගයනු ලැබේ. ඵලදායී පොලී අනුපාත ක්‍රමක්ෂය විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි සඳහන් මූල්‍ය ආදායම තුළ හඳුනා ගනු ලැබේ. දුබලත්වය හේතුවෙන් පැන නගින අලාභ, මූල්‍ය පිරිවැයෙහි සඳහන් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ.
රජයේ සුරැකුම් පත් සහ ස්ථිර තැන්පතුවල කරනු ලබන ආයෝජන, කල් පිරීමට නියමිත ආයෝජන යටතේ වර්ගීකරණය කරනු ලැබ ඇත

**ඇ. විකිණීමට හැකි මූල්‍ය ආයෝජන**

විකිණීමට හැකි ලෙස හෝ ඉහත සඳහන් මූල්‍ය වත්කම් වර්ගීකරණ කිසිවක් තුළ වර්ගීකරණය කර නොමැති ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්, විකිණීමට හැකි මූල්‍ය වත්කම් වේ. මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව, එම වත්කම් සාධාරණ වටිනාකම හා එහි වෙනස්කම් අනුව අගයනු ලබන අතර, දුබලතා අලාභ හැර වෙනත් විස්තීර්ණ ආදායම් තුළ හඳුනා ගනු ලබන අතර, **අරමුදල් සහ සංචිත වල තැන්පත් කර ඇති සාධාරණ වටිනාකමින් ඉදිරිපත් කරනු ලැබේ.** විකිණීමට හැකි ණය සුරැකුම් මත පොලී ආදායම ඵලදායී පොලී අනුපාත ක්‍රමවේදය භාවිත කරමින් ගණනය කරනු ලබන අතර, ලාභ හෝ අලාභ තුළ හඳුනා ගනු ලැබේ. යම් ආයෝජනයක් හඳුනා ගනු නොලැබූ විට, අරමුදල් හා සංචිත තුළ සමුච්චිත ලැබීම් හෝ පාඩු, ලාභ හෝ අලාභ ගිණුමෙහි නැවත වර්ගීකරණය කරනු ලැබේ.

මූලික හඳුනා ගැනීම මත, සමාගම විසින් කිසිදු මූල්‍ය වත්කමක් විකිණීමට හැකි ආයෝජනයක් ලෙස හඳුනා ගනු ලැබ නොමැත.

**1.2.7 මූල්‍ය වත්කම් දුබලත්වයට පත්වීම**

සමාගම විසින් සෑම වාර්තා කරනු ලබන දිනකදීම, මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් දුබලත්වයට පත්වී ඇති බවට හරයාත්මක සාක්ෂි පවතීදැයි අගයනු ලබන අතර, එවැනි දුබලත්වයක් සිදු වී ඇත්නම්, එම දුබල වී ඇති ප්‍රමාණය ගණනය කරනු ලබන්නේ, වත්කම් දැරීමේ වටිනාකම සහ ඇස්තමේන්තු ගත ඉදිරි මුදල් ප්‍රවාහයේ වත්මන් වටිනාකම අතර වෙනස ලබා ගනිමිනි.

**1.2.8 මුදල් හා මුදල් සමානයන්**

අතැති මුදල්, බැංකු තැන්පතු සහ නැවත මිලදී ගැනීමේ ගිවිසුම් යනාදියෙන් මුදල් සහ මුදල් සාම්‍යයන් සමන්විත වේ.
"ඍජු නොවන ක්‍රමවේදය" භාවිතා කරමින් සකස් කරනු ලැබ ඇති මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා මුදල් සහ මුදල් සාම්‍යයන්ගේ අංගයක් ලෙස බැංකු අයිරාව ඇතුලත් කරනු ලැබේ.

### 1.3 වගකීම් සහ ප්‍රතිපාදන

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලබන වගකීම් වනුයේ, ඉල්ලීම මත හෝ වාර්තා කරනු ලබන දින සිට එක් වර්ෂයක් තුළ ගෙවීම සඳහා හිඟ ලෙස පවතිනු ලබන ශේෂයන් ය. වාර්තා කරනු ලබන දින සිට එක් වර්ෂයකට පසු ගෙවීම සඳහා හිඟ ලෙස පවතිනු ලබන ශේෂයන් ජංගම නොවන වත්කම් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී, දත් සියලුම වගකීම් සලකා බලනු ලැබේ. අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස නෛතික හෝ සාධනීය වගකීමක් සමාගම සතුවන අවස්ථාවේදී, ප්‍රතිපාදන සහ වගකීම් හඳුනා ගනු ලබන අතර, මෙම වගකීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලා යාමක් අවශ්‍ය වනු ඇත.

#### 1.3.1 සේවක ප්‍රතිලාභ

**අ. විශ්‍රාම පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන**

1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ, සියලුම සුදුසුකම් ලත් සේවකයින් උදෙසා සමාගම විසින් ප්‍රතිලාභ සැලැස්මක් අදාළ කරගනු ලැබ ඇත. මෙම ප්‍රතිලාභ සැලැස්ම සඳහා බාහිර වශයෙන් අරමුදල් සපයනු නොලැබේ.

මෙම ප්‍රතිපාදන ගණනය කිරීමේදී භාවිත කරනු ලබන මූලික පූර්ව නිගමන තුළ පහත දැක්වෙන කරුණු ඇතුලත් වේ :

| | |
|---|---|
| වට්ටම් අනුපාතය | 12% |
| ඉදිරි වැටුප් වැඩිවීම් අනුපාතය | 10% |
| කාර්ය මණ්ඩල පිරිවැටුම | 02% |
| විශ්‍රාම ගැනීමේ වයස | අවුරුදු 55 |

සමාගම ක්‍රියාත්මක තත්වයේ ව්‍යාපාරයක් ලෙස අඛණ්ඩව පවත්වාගෙන යනු ඇත.

**ආ. නිශ්චිත දායකත්ව සැලැස්ම**

නිශ්චිත දායකත්ව සැලැස්ම පශ්චාත් සේවා නියුක්ති සැලැස්මක් වන අතර, ඒ යටතේ ආයතනයක් විසින් වෙනත් යම් ආයතනයක් වෙත ස්ථිර දායකත්වයක් ගෙවනු ලබන අතර, අමතර වටිනාකමක් ගෙවීම සඳහා ඊට කිසිදු නෛතික හෝ සම්ප්‍රයුක්ත බැඳීමක් හිමි නොවනු ඇත. නිශ්චිත දායකත්ව සැලැස්ම සඳහා වන දායකත්ව වෙනුවෙන් වන වගකීම්, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හිඟ ලෙස පෙන්නුම් කෙරෙන පරිදි සහ ඒවා නියමිත වන්නා වූ අවස්ථාවන්හිදී එම ප්‍රකාශයෙහි වියදමක් ලෙස හඳුනා ගනු ලැබේ.

**ඇ. සේවක අර්ථසාධක අරමුදල**

එක් එක් සේවකයකුගේ වැටුප මත සමාගම සහ සේවකයා විසින් පිළිවෙළින්, 12% හා 8% බැගින් වන පරිදි, අනුමත කරන ලද අර්ථසාධක අරමුදල වෙත සිය දායකත්වය සලසා දෙනු ලැබේ.

**ඇ. සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල**

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් විසින් එක් එක් සේවකයකුගේ වැටුප මත 3% ක් වූ ප්‍රමාණයක් අනුව සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල වෙත සිය දායකත්වය සලසා දෙනු ලැබේ.

#### 1.3.2 වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ

වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ ගත් මිල මත සඳහන් කරනු ලැබේ.

#### 1.3.3 බදුකරණය

ලාභාංශ හෝ පොලී වලින් ලද අතිරික්තය සහ ආදායම් හැර, සමාගමේ අතිරික්තය සහ ආදායම්, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතෙහි 7 ආ (ixiv) වගන්තිය යටතේ ආදායම් බදු වලින් නිදහස් කෙරේ.

#### 1.3.4 කල් තබන ලද බදුකරණය

සමාගමේ අතිරික්තය සහ ආදායම, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතෙහි 7 (ixiv) වගන්තිය යටතේ ආදායම් බදු වලින් නිදහස් කර ඇති හෙයින්, විලම්බිත බදු සඳහා විධිවිධාන සකස් කර නොමැත.

#### 1.3.5 ප්‍රාග්ධන වගකීම් හා අවිනිශ්චිත වගකීම්

අවිනිශ්චිත වගකීම් යනු, ආර්ථික ප්‍රතිලාභ පැවරීම සිදු කළ නොහැකි හෝ නිසියාකාරව ගණනය කළ නොහැකි අවිනිශ්චිත අනාගත සිදුවීම් හෝ වර්තමාන වගකීම් වලින් පමණක් පැවැත්ම සහතික කරනු ලැබිය හැකි වගකීම් ය.

මූල්‍ය ප්‍රකාශවලට සිදු කරන අදාළ සටහන්හි සමාගමේ ප්‍රාග්ධන වගකීම් සහ අවිනිශ්චිත වගකීම් අනාවරණය කරනු ලැබේ.

## 1.4 විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

**ප්‍රාග්ධන සංචිතය (ප්‍රාග්ධන ප්‍රදානවලට අදාළව)**

වර්ෂ 2011 සිට සෞඛ්‍ය අමාත්‍යාංශය, කෙයා (CARE) ආයතනය සහ ශ්‍රී ලංකා දුම්කොළ සමාගම විසින් ස්ථිර වත්කම් මත වැය කරන ලද අරමුදල්, ප්‍රාග්ධන ප්‍රදාන ලෙස සලකනු ලැබ ඇති අතර, ඒ අනුව, වර්ෂය සඳහා සමස්ත ක්ෂය කිරීම් සඳහා හිලව් කිරීම සිදු කරමින්, මෙම විෂයන්ට අදාළ ක්ෂය කිරීම් අදාළ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම්වලට ඇතුලත් කරනු ලැබ ඇත.

### 1.4.1 ප්‍රදාන

යම් ප්‍රදානයක් ලැබෙන බවට සහ ඊට යා කොට ඇති කොන්දේසි හා අනුගත වනු ඇති බවට සාධාරණ සහතික විමක් පවතින අවස්ථාවකදී රජයේ ප්‍රදාන හඳුනා ගනු ලැබේ.

සමාගම තුළ ඇති කෙරෙනු ලබන වියදම් වෙනුවෙන් ඒ වෙත පිරිනමනු ලබන ප්‍රදාන, එම වියදම් හඳුනා ගනු ලබන වර්ෂයේ ම විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ ආදායම් ලෙස හඳුනා ගනු ලැබේ. යම් වත්කමක පිරිවැය සඳහා සමාගම වෙත ලබා දෙනු ලබන ප්‍රදාන, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ.

### 1.4.2 වියදම්

අ. ජනනය වූ පිරිවැය සහ සුවිශේෂී ආදායම් වර්ග ඉපැයීම් අතර සෘජු සබඳතාව මත පදනම්ව, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ වියදම් හඳුනා ගනු ලැබේ. සමාගමෙහි මෙහෙයුම් කටයුතුවලදී සහ කාර්යක්ෂම අවස්ථාවන්හි දී ප්‍රාග්ධන වත්කම් නඩත්තු කිරීමේදී ඇති වන සියලුම වියදම්, එම වර්ෂය සඳහා අතිරික්තය ගණනය කිරීමේදී ආදායම්හි ප්‍රතිපාර්ශ්වීය ලෙස අය කරගනු ලැබ ඇත.

### 1.4.3 මූල්‍ය වියදම් /ආදායම්

ආයෝජනය කරන ලද අරමුදල් සඳහා උපචිත පදනම මත ලද පොලියෙන් මූල්‍ය ආදායම සමන්විත වේ.

## 1.5 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රතිපත්ති 7 හා අනුගතව සකස් කරනු ලැබ ඇත.

## 1.6 වාර්තා කිරීමේ කාල සීමාව අවසානයේ සිදුවීම්

වාර්තා කිරීමේ කාල සීමාවෙන් පසුව මූල්‍ය ප්‍රකාශ තුළ ගැළපුම් හෝ අනාවරණ අවශ්‍ය වන්නාවූ සැලකිය යුතු සිදුවීම් කිසිවක් නොමැත.

## 1.7 නිකුත් කරන ලද, එහෙත් තවමත් ක්‍රියාත්මකභාවයේ නොමැති ප්‍රමිතීන්

සමාගමෙහි වාර්ෂික මූල්‍ය ප්‍රකාශ නිකුත් කළ දින දක්වා නිකුත් කරන ලද, එහෙත් තවමත් ක්‍රියාත්මකභාවයේ නොමැති ප්‍රමිතීන් පහත දැක්වේ. නිකුත් කරන ලද ප්‍රමිතීන් සහ අර්ථ නිරූපණ ලේඛනය යනු, ඉදිරි දිනකදී අදාළ කරගනු ලබන අවස්ථාවකදී අනාවරණය කිරීම්, මූල්‍ය තත්ත්වය හෝ කාර්ය සාධනය මත බලපෑමක් ඇති කෙරෙනු ඇති බවට සමාගම විසින් සාධාරණතාව අපේක්ෂා කරනු ලබන ප්‍රමිතීන් සහ අර්ථ නිරූපණ වේ. මෙම ප්‍රමිතීන් බලාත්මක වනු ලබන අවස්ථාවේදී, එම ප්‍රමිතීන් අදාළ කරගනු ලැබීමට සමාගම විසින් අපේක්ෂා කරනු ලබයි.

**අ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 9 මූල්‍ය උපකරණ :**

වර්ගීකරණය සහ ගණනය කිරීමේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 9 මඟින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39 ආදේශ වනු ලබන අතර, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39 හි අර්ථ නිරූපිත මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් වර්ගීකරණය සහ ගණනය කිරීම සඳහා අදාළ කරගනු ලැබේ. මෙම ප්‍රමිතියෙහි අනිවාර්ය බලාත්මක දිනය කල් තබා ඇත. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 9 හි පළමු අදියර අදාළ කර ගැනීම මඟින් සමාගමෙහි මූල්‍ය වත්කම් වල වර්ගීකරණය සහ ගණනය කිරීම මත බලපෑමක් ඇති කරනු ලබන නමුත්, වාස්තවිකව මූල්‍ය වගකීම් වර්ගීකරණය සහ ගණනය කිරීම මත කිසිදු බලපෑමක් ඇති නොකරනු ලැබේ. විස්තරාත්මක ඉදිරිපත් කිරීමක් ඉදිරිපත් කිරීම පිණිස, නිකුත් කරනු ලැබූ විට, සමාගම විසින් අනෙකුත් අදියරයන් හා එක්ව ගෙන එහි බලපෑම ගණනය කරනු ලැබේ.

## 1.8 විකිණීම සඳහා තබා ගන්නා ලද ජංගම නොවන වත්කම්

නිරන්තර භාවිතය හරහා නොව මූලිකව, බැහැර කිරීම මඟින් නැවත ලබා ගැනීමට අපේක්ෂිත ජංගම නොවන වත්කම්, විකිණීම සඳහා තබා ගන්නා ලද වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. විකුණුම සඳහා තබා ගන්නා ලද වත්කම් ලෙස වර්ගීකරණය කිරීමට ප්‍රථම වහාම, සමාගමෙහි ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනුගතව මෙම වත්කම් නැවත ගණනය කරනු ලැබේ. ඉන් පසුව, එම වත්කම්හි වටිනාකමට අඩු වටිනාකම සහ විකුණුම් පිරිවැය අඩු කරන ලද සාධාරණ වටිනාකම යටතේ එම වත්කම් ගණනය කරනු ලැබේ. විකිණීම සඳහා තබා ගන්නා ලද, මූලික වර්ගීකරණය කිරීම මත හායන පාඩු සහ නැවත ගණනය කිරීම මත ලද පසු කාලීන ලැබීම් හෝ පාඩු, ලාභ හෝ අලාභ තුළ හඳුනා ගනු ලැබේ. කිනම් හෝ සමුච්චිත හායන පාඩුවක් ඉක්මවා ලැබීම් හඳුනා ගනු නොලැබේ.

### ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්
### මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්
### 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | 2017/12/31<br>රු. ශත. | 2016/12/31<br>රු. |
|---|---|---|
| **02. ආදායම** | | |
| අයභාරය | **1,894,082,547.67** | 1,469,302,573 |
| ක්ෂය විම් | **55,316,859.32** | - |
| සුපෝෂ විකුණුම් | **232,322,965.45** | - |
| හයිලන්ඩ් නිෂ්පාදන විකුණුම් | **1,983,925.00** | - |
| | **2,183,706,297.44** | 1,469,302,573 |
| **03. පරිභෝජනයට සූදානම් නිෂ්පාදන වල පිරිවැය** | | |
| 2017.01.01 දිනට නිමවූ නිෂ්පාදන | **34,050,017.76** | 38,202,137 |
| මුළු නිෂ්පාදන පිරිවැය | **1,895,472,226.80** | 1,395,753,200 |
| 2017.12.31 දිනට නිමවූ නිෂ්පාදන | **(24,913,203.12)** | (34,050,018) |
| | **1,904,609,041.44** | 1,399,905,319 |
| **04. විකුණුම් පිරිවැය** | | |
| 2017.01.01 දිනට ශේෂය | - | - |
| ලැබීම් - සුපෝෂ | **157,741,777.01** | - |
| විකුණුම් - හයිලන්ඩ් නිෂ්පාදන | **1,974,605.00** | - |
| විකුණුම් - ඇසුරුම් ද්‍රව්‍ය | **21,993,437.81** | - |
| | **181,709,819.82** | - |
| 2017.12.31 දිනට ශේෂය | **(13,650,007.36)** | - |
| | **168,059,812.46** | - |
| **05. වෙනත් ආදායම්** | | |
| අපතය විකුණුම් | **17,681,220.75** | 11,831,513 |
| නිවාස ණය පොලි | **964,732.37** | 1,086,085 |
| භාණ්ඩාගාර බිල්පත් මත පොලි ආදායම් | **8,027,273.54** | 6,793,074 |
| ස්ථාවර තැන්පතු පොලි | **1,375,209.62** | - |
| වෙනත් | **933,894.42** | - |
| | **28,982,330.70** | 19,710,673 |
| **06. විකුණුම් හා බෙදාහැරීමේ පිරිවැය** | | |
| ප්‍රවාහන අය කිරීම් | **10,696,894.95** | 6,929,064 |
| සුපෝෂ ආරම්භ කිරීමේ වියදම් | **6,148,461.40** | - |
| ප්‍රදර්ශනාගාර වියදම් | **145,048.30** | - |
| මුද්‍රණ හා වෙළඳ දැන්වීම් | **4,423,219.87** | 117,250 |
| | **21,413,624.52** | 7,046,314 |

### ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්
### මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්
### 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

**07. පරිපාලන වියදම්**

| | 2017/12/31<br>රු. ශත. | 2016/12/31<br>රු. |
|---|---|---|
| වැටුප් | 8,657,441.25 | 5,982,698 |
| සේවක අර්ථසාධක අරමුදල | 1,918,229.72 | 1,076,558 |
| සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල | 430,309.49 | 289,808 |
| අතිකාල දීමනා | 1,854,988.84 | 708,400 |
| දීමනා | 4,402,693.61 | 6,567,820 |
| අනියම් වේතන | 189,533.32 | - |
| අනියම් වේතන මත සේවක අර්ථසාධක අරමුදල | 41,333.34 | - |
| අනියම් වේතන මත සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල | 6,800.00 | - |
| කළමනාකරණ දීමනා | 5,478,402.34 | 4,033,560 |
| කාර්යමණ්ඩල සුබසාධනය | 2,054,131.47 | 2,151,417 |
| බදු හා කුළී | 320,502.97 | 445,036 |
| කාර්යාල උපකරණ නඩත්තු | 1,456,957.60 | 729,128 |
| ආරක්ෂක ගාස්තු | 6,955,721.65 | 7,034,083 |
| මෝටර් වාහන ඉන්ධන | 1,823,139.46 | 120,425 |
| අළුත්වැඩියා හා නඩත්තු - වාහන | 1,748,065.20 | 2,154,768 |
| ලිපි ද්‍රව්‍ය | 2,132,294.42 | 674,102 |
| තැපැල් ගාස්තු | 271,405.00 | 239,625 |
| දුරකථන ගාස්තු | 605,073.20 | 584,151 |
| කාර්යමණ්ඩල පුහුණු කිරීමේ ගාස්තු | 4,342,465.16 | 299,800 |
| නෛතික හා වෘත්තිය ගාස්තු | 587,475.00 | 565,819 |
| බලපත්‍ර හා රක්ෂණ ගාස්තු | 1,034,620.46 | 1,152,696 |
| වෛද්‍ය සහ සනිපාරක්ෂණ | 469,715.84 | 200,256 |
| ගමන් වියදම් | 83,600.00 | 47,400 |
| පරිත්‍යාග | 297,000.00 | 167,000 |
| අපතය වියදම් | - | 127,571 |
| ක්ෂය වීම් | 7,398,374.71 | - |
| | 54,560,274.05 | 35,352,121 |

**08. මූල්‍ය හා වෙනත් වියදම්**

| | | |
|---|---|---|
| බැංකු ගාස්තු | 39,579.72 | 26,741 |
| පරිත්‍යාග | 124,000.00 | - |
| ව්‍යපහරණ අලාභ | 29,688.80 | - |
| නැවත සකස්කිරීමේ අලාභය | 2,355.61 | 199,119 |
| | 195,624.13 | 225,860 |

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්
2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | 2017/12/31 රු. ශත. | 2016/12/31 රු. |
|---|---|---|
| **09. සෘජු ශ්‍රම සහ කළමනාකරණ පිරිවැය** | | |
| වැටුප් | **53,797,905.81** | 35,923,672 |
| සේවක අර්ථසාධක අරමුදල | **8,770,169.27** | 6,181,278 |
| සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල | **2,179,510.14** | 1,684,324 |
| අතිකාල දීමනා | **45,254,998.24** | 19,830,216 |
| දීමනා | **32,668,216.68** | 43,774,461 |
| පාරිතෝෂිත | **9,185,604.50** | 8,841,796 |
| සේවා පර්යන්ත ගෙවීම් | **275,819.32** | 30,347 |
| නිල ඇඳුම් සහ සේදුම් වියදම් | **3,008,960.30** | 3,797,130 |
| තේ හා වෙනත් | **3,309,275.60** | 3,462,466 |
| මුර මාරු හා ආහාර දීමනා | **2,108,280.80** | 1,189,471 |
| වෛද්‍ය සහ සනිපාරක්ෂණ | **804,335.23** | 102,787 |
| අනියම් හා කොන්ත්‍රාත් සේවක වැටුප් | **5,303,975.53** | 2,226,559 |
| අනියම් හා කොන්ත්‍රාත් සේවක වැටුප් මත සේවක අර්ථසාධක අරමුදල | **316,484.63** | 353,120 |
| අනියම හා කොන්ත්‍රාත් සේවක වැටුප් මත සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල | **115,534.79** | 88,280 |
| සුබසාධනය පිරිවැය | **818,491.77** | 830,954 |
| දිරි දීමනා | **10,684,318.85** | 7,008,079 |
| | **178,601,881.46** | 135,324,941 |

| | 2017/12/31 රු. ශත. | 2016/12/31 රු. |
|---|---|---|
| **10. කම්හල් පොදු කාර්ය පිරිවැය** | | |
| විදුලි ජනකය සඳහා ඉන්ධන | **29,923,937.04** | 24,779,636 |
| කම්හල් නඩත්තු ගාස්තු | **64,081.43** | 2,001,872 |
| පිරියත හා යන්ත්‍රෝපකරණ නඩත්තු | **20,897,237.88** | 17,772,374 |
| විද්‍යාගාර වියදම් | **1,962,475.22** | 1,396,720 |
| විදුලි වියදම් | **28,037,764.45** | 26,302,092 |
| ගොඩනැගිලි අළුත්වැඩියා හා නඩත්තු | **3,497,475.14** | 11,841,777 |
| වෙනත් සේවා හා නඩත්තු | **8,505,275.76** | 1,662,565 |
| උද්‍යාන නඩත්තුව | **70,380.00** | 70,635 |
| භායන අලාභ | **66,286.87** | - |
| ක්ෂය වීම් | **48,776,292.38** | - |
| | **141,801,206.17** | 85,827,670 |

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්
2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

## 11. දේපළ, පිරියත හා උපකරණ

| පිරිවැය / ප්‍රත්‍යාගණනය | 2017.01.01 දිනට ශේෂය | එකතු කිරීම් | මාරු කිරීම් | 2017.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| ඉඩම් | 220,000,000.00 | - | - | **220,000,000.00** |
| ගොඩනැගිලි | 110,186,925.86 | 24,537,530.40 | - | **134,724,456.26** |
| පිරියත හා උපකරණ | 376,723,003.55 | 23,125,410.23 | (2,771,089.01) | **397,077,324.77** |
| මෝටර් රථ | 22,208,750.00 | 4,240,000.00 | (753,750.00) | **25,695,000.00** |
| උපකරණ හා අම්පන්න | 13,626,324.53 | 351,652.50 | - | **13,977,977.03** |
| විද්‍යාගාර උපකරණ | 5,982,412.00 | 2,510,335.85 | - | **8,492,747.85** |
| කෘෂිකාර්මික උපකරණ | 138,650.00 | - | - | **138,650.00** |
| විදුලි වැඩ | 6,159,034.76 | - | - | **6,159,034.76** |
| කාර්යාල උපකරණ | 14,538,636.09 | 3,265,246.29 | - | **17,803,882.38** |
| ගෘහ භාණ්ඩ හා උපාංග | 4,761,567.67 | 2,119,849.64 | (136,400.00) | **6,745,017.31** |
| | 774,325,304.46 | 60,150,024.91 | (3,661,239.01) | **830,814,090.36** |

| සමුච්චිත ක්ෂය කිරීම් | 2017.01.01 දිනට ශේෂය | වර්ෂය සඳහා අය | මාරු කිරීම් | 2017.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| ගොඩනැගිලි | 15,452,279.07 | 5,929,819.85 | - | **21,382,098.92** |
| පිරියත හා උපකරණ | 60,155,035.87 | 39,162,542.76 | (1,154,620.57) | **98,162,958.06** |
| මෝටර් රථ | 12,279,792.17 | 5,124,833.33 | (628,125.50) | **16,776,500.00** |
| උපකරණ හා අම්පන්න | 9,475,430.08 | 1,923,357.91 | - | **11,398,787.99** |
| විද්‍යාගාර උපකරණ | 2,209,713.20 | 720,579.40 | - | **2,930,292.60** |
| කෘෂිකාර්මික උපකරණ | 57,770.83 | 13,865.00 | - | **71,635.83** |
| විදුලි වැඩ | 1,570,816.21 | 1,026,127.46 | - | **2,596,943.67** |
| කාර්යාල උපකරණ | 4,312,820.88 | 1,580,614.31 | - | **5,893,435.19** |
| ගෘහ භාණ්ඩ හා උපාංග | 1,616,946.93 | 527,630.18 | (56,684.58) | **2,087,892.53** |
| | 107,130,605.24 | 56,009,370.20 | (1,839,430.65) | **161,300,544.79** |

| ලියා අඩු කළ අගයන් | 2017.12.31 දිනට ශේෂය රු. ශත. | 2016.12.31 දිනට ශේෂය රු. |
|---|---|---|
| ඉඩම් | **220,000,000.00** | 220,000,000 |
| ගොඩනැගිලි | **113,342,357.34** | 94,734,647 |
| පිරියත හා උපකරණ | **298,914,366.71** | 316,567,968 |
| මෝටර් රථ | **8,918,500.00** | 9,928,958 |
| උපකරණ හා අම්පන්න | **2,579,189.04** | 4,150,894 |
| විද්‍යාගාර උපකරණ | **5,562,455.25** | 3,772,699 |
| කෘෂිකාර්මික උපකරණ | **67,014.17** | 80,879 |
| විදුලි වැඩ | **3,562,091.09** | 4,588,219 |
| කාර්යාල උපකරණ | **11,910,447.19** | 10,225,815 |
| ගෘහ භාණ්ඩ හා සවිකිරීම් | **4,657,124.78** | 3,144,621 |
| | **669,513,545.57** | 667,194,699 |

## ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්
## මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්
## 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

**12. අස්පෘශ්‍ය වත්කම්**

| | 2017.12.31 දිනට ශේෂය රු. ශත. | 2016.12.31 දිනට ශේෂය රු. |
|---|---|---|
| පිරිවැය | **661,187.57** | 661,188 |
| සමුච්චිත ක්ෂය කිරීම් | **(330,593.78)** | (165,297) |
| ලියා අඩු කළ අගය | **330,593.79** | 495,891 |

**13. ආයෝජන**

| | | |
|---|---|---|
| භාණ්ඩාගාර බිල්පත් - මුහුණත් වටිනාකම | **92,500,000.00** | 92,359,000 |
| ලැබිය යුතු භාණ්ඩාගාර බිල්පත් පොලී ආදායම | **488,271.97** | 282,170 |
| ස්ථාවර තැන්පතු - අලුත් කිරීමේ අගය | **46,400,000.00** | - |
| ස්ථාවර තැන්පතු - පොලී ආදායම | **1,375,209.62** | - |
| | **140,763,481.59** | 92,641,170 |

### ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්
### මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්
### 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| 14 වට්ටෝරු භාණ්ඩ | 2017/12/31<br>රු. ශත. | 2016/12/31<br>රු. |
|---|---|---|
| **අමු ද්‍රව්‍ය** | | |
| ඉරිඟු | **23,778,877.50** | 18,732,378 |
| සෝයා | **61,829,570.00** | 93,212,873 |
| කිරි පිටි | **44,185,500.00** | 31,833,000 |
| ඛනිජ ලවණ | **6,175,200.00** | 114,540 |
| විටමින් | **895,878.75** | 2,549,809 |
| | **136,865,026.25** | 146,442,600 |
| **ඇසුරුම් අමුද්‍රව්‍ය** | | |
| පොලිතින් බෑග් | **2,851,425.00** | 2,890,755 |
| පොලිතින් රීල් | **6,478,913.53** | 1,029,347 |
| ක්‍රාෆ්ට් කඩදාසි බෑග් | **442,318.75** | 934,950 |
| ට්වයින් නූල් | **146,775.93** | 211,711 |
| | **9,919,433.21** | 5,066,763 |
| **වෙනත්** | | |
| ඩීසල් | **2,490,425.00** | 2,248,175 |
| ඉංජිනේරු ගබඩා | **9,856,216.69** | 10,085,039 |
| | **12,346,641.69** | 12,333,214 |
| **කෙරෙමින් පවත්නා වැඩ** | | |
| **අමු ද්‍රව්‍ය** | | |
| ඉරිඟු | **535,500.00** | 5,259,870 |
| සෝයා | **748,000.00** | 1,533,410 |
| කිරි පිටි | **263,250.00** | 627,750 |
| ඛනිජ ලවණ | **16,600.00** | 186,128 |
| විටමින් | **68,913.75** | 96,479 |
| **ඇසුරුම් අමුද්‍රව්‍ය** | | |
| පොලිතින් බෑග් | **200,583.00** | 171,086 |
| පොලිතින් රීල් | **345,543.03** | 263,231 |
| ක්‍රාෆ්ට් කඩදාසි බෑග් | **201,905.50** | 72,303 |
| ට්වයින් නූල් | **8,633.88** | 5,227 |
| | **2,388,929.16** | 8,215,484 |
| **නිමි භාණ්ඩ** | | |
| ළමා | **17,521,889.20** | 22,113,360 |
| මාතෘ | **7,391,313.92** | 11,936,658 |
| | **24,913,203.12** | 34,050,018 |
| **අලෙවි අංශය** | | |
| සුපෝෂ | **8,333,723.73** | |
| ඇසුරුම් අමුද්‍රව්‍ය | **5,140,009.38** | |
| හයිලන්ඩ් නිෂ්පාදන | **176,274.25** | |
| | **13,650,007.36** | - |
| එකතුව | **200,083,240.79** | 206,108,079 |

# ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්
## මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්
### 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | 2017/12/31<br>රු. ශත. | 2016/12/31<br>රු. |
|---|---|---|
| **15 වෙළඳ හා වෙනත් ලැබීම්** | | |
| ණයකරුවන් | **59,264,120.75** | 50,945,138 |
| ණයකරුවන් - අලෙවි | **45,902,856.75** | - |
| අත්තිකාරම් සහ පූර්ව ගෙවීම් | **19,213,183.16** | 3,087,658 |
| තැන්පතු | **1,876,000.00** | 1,088,500 |
| නිවාස ණය - වත්කම් | **13,707,572.62** | 10,848,130 |
| නිවාස ණය - ආපදා | **9,350,359.61** | 9,403,575 |
| උත්සව අත්තිකාරම් | **25,000.00** | - |
| විනෝද චාරිකා අත්තිකාරම් | **11,500.00** | 147,500 |
| | **149,350,592.89** | 75,520,501 |
| **16 මුදල් හා මුදල් සමාන දෑ** | | |
| ලංකා බැංකුව, ජා ඇල 71324617 | **13,530,026.05** | 12,310,647 |
| ලංකා බැංකුව, ජා ඇල ගිණුම් අංක 80306903 | **45,902,793.32** | - |
| සුළු මුදල් | **20,000.00** | - |
| | **59,452,819.37** | 12,310,647 |

**17 ප්‍රකාශිත ප්‍රාග්ධනය**

අමාත්‍ය මණ්ඩලය විසින් ගන්නා ලද තීරණයක ප්‍රතිඵලයක් ලෙස, ත්‍රිපෝෂ සමාගමේ කළමනාකාරිත්වය, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාපනය කරන ලද සම්පූර්ණ රජය සතු පොදු සීමිත සමාගමක් වෙත පවරනු ලැබ ඇත. ඒ අනුව, රු. 304,600,000/= ක (රුපියල් තුන් සිය හතර මිලියන හයසිය දහසක්) ප්‍රකාශිත ප්‍රාග්ධනය සහිතව 2010 සැප්තැම්බර් මස 17 වන දින ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් නමැති සමාගම සංස්ථාපනය කරන ලදී.

| | 2017/12/31 | 2016/12/31 |
|---|---|---|
| **18 ප්‍රාග්ධන සංචිත** | | |
| වර්ෂය මුල ශේෂය | **380,421,185.24** | 307,575,084 |
| සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන | **50,450,123.25** | 102,406,370 |
| ප්‍රාග්ධන වත්කම් සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලද අත්තිකාරම් | **19,936,617.83** | - |
| අඩු කළා : වර්ෂය සඳහා ක්ෂය කිරීම් ගාස්තු | **(55,316,859.32)** | (29,560,268) |
| වර්ෂ අවසානයේ ශේෂය | **395,491,067.00** | 380,421,185 |
| **19 ප්‍රත්‍යාගණන සංචිත** | | |
| වර්ෂය මුල ශේෂය | **307,170,027.56** | 307,170,028 |
| ව්‍යපහරණ වත්කම් මත ප්‍රත්‍යාගණන ලාභ / අලාභ | **(791,369.91)** | - |
| වර්ෂය අවසානයේ ශේෂය | **306,378,657.65** | 307,170,028 |
| **20 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්** | | |
| වර්ෂය මුල ශේෂය | **37,858,775.50** | 29,593,685 |
| අඩු කළා : වර්ෂය තුළ ගෙවීම් | **(4,087,601.00)** | (576,705) |
| 2017 වර්ෂය සඳහා ප්‍රතිපාදන | **9,185,604.50** | 8,841,796 |
| වර්ෂය අවසානයේ ශේෂය | **42,956,779.00** | 37,858,776 |
| වට්ටම් ගත අනුපාතය | **12%** | 12% |
| ඉදිරි වැටුප් වර්ධක අනුපාතය | **10%** | 10% |
| කාර්ය මණ්ඩල පිරිවැටුම් | **2%** | 2% |
| විශ්‍රාම ගැනීමේ වයස | අවුරුදු 55 | අවුරුදු 55 |

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්
2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | 2017/12/31 රු. ශත. | 2016/12/31 රු. |
|---|---|---|
| **21 වෛද්‍යාධාර අරමුදල** | | |
| වර්ෂය මුල ශේෂය | 238,678.90 | 241,490 |
| වර්ෂය තුළ දායකවීම් | 98,600.00 | 193,600 |
| වර්ෂය තුළ ගෙවීම් | (160,856.55) | (196,411) |
| වර්ෂය අවසානයේ ශේෂය | 176,422.35 | 238,679 |

| | 2017/12/31 රු. ශත. | 2016/12/31 රු. |
|---|---|---|
| **22 වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු** | | |
| ණය හිමියන් | 59,782,065.42 | 20,573,379 |
| උපචිත වියදම් | 506,732.10 | 109,808 |
| ආපසු ගෙවනු ලබන තැන්පතු | 48,503,237.50 | 179,338 |
| උත්සව අත්තිකාරම් | - | 36,250 |
| සෞඛ්‍ය අමාත්‍යංශය | 22,033,800.94 | - |
| | 130,825,835.96 | 20,898,774 |

| | 2017/12/31 රු. ශත. | 2016/12/31 රු. |
|---|---|---|
| **23 පූර්ව වර්ෂ ගැළපුම්** | | |
| ලැබිය යුතු ගිණුම්වලට අදාළ ගැළපුම් | 27,633,145.35 | - |
| වියදම් ගිණුමට අදාළ ගැළපුම් | 235,138.75 | 23,576 |
| | 27,868,284.10 | 23,576 |

**24 ප්‍රාග්ධන ප්‍රදාන හා සම්බන්ධ ක්ෂය කිරීම්**

සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ප්‍රදානය කර ඇති ස්ථාවර වත්කම්වලට අදාළ ක්ෂය කිරීම්, එම වර්ෂයේ මුළු ක්ෂය කිරීමේ ගාස්තු අඩු කරමින් අදාළ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමට අය කරගනු ලැබ ඇත.

**25 බැඳියා සහ අවිනිශ්චිතතා**

වාර්තා කරනු ලබන දිනයේදී කිසිදු සැලකිය යුතු බැඳියාවක් හෝ අවිනිශ්චිතතාවක් නොපැවතිණි.

**26 සම්බන්ධිත පාර්ශව හෙළිදරව් කිරීම්**

**ප්‍රධාන පෙළේ කළමනාකරණ නිලධාරීන් හා පවත්නා ගනුදෙනු**

සමාගමෙහි ප්‍රධාන පෙළේ කළමනාකරණ නිලධාරීන් වනුයේ, එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෝ ය.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය / எனது இல. / My No. } එච්එස්එම්/එෆ්/එස්එල්ටීසී/01/17/07  ඔබේ අංකය / உமது இல. / Your No. }  දිනය / திகதி / Date } 2018 ජුලි 06 දින

සීමාසහිත ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ කොටස් හිමියන් වෙත,

**සීමාසහිත ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව.**

සීමාසහිත ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ නිෂ්පාදන ගිණුම, ආදායම් හා වියදම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මණ්ඩලයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම හා වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ("මණ්ඩලය") වගකීම වේ.

**විගණකගේ වගකීම**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, .- இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරුකිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළවන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ සුපෝෂ නිෂ්පාදන පිරිවැය හා ත්‍රිපෝෂ නිමි තොගවල පිරිවැය පිළිවෙලින් රු.9,434,309 ක් හා රු.858,924 කින් වැඩියෙන් ගණනය කර ගිණුම්ගත කර තිබුණි.

(ආ) භාණ්ඩාගාර බිල්පත් හා ස්ථාවර තැන්පත් පොලී ආදායම පිළිවෙලින් රු.891,919 කින් හා රු.1,333,444 කින් අඩුවෙන් ගණනය කර ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී ණයගැතියන්ගෙන් සෘජුවම බැංකුවට ලැබී තිබුණු රු.18,429,850 ක්, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය වෙතින් ප්‍රතිපූර්ණය කර ගත යුතු පුනරාවර්තන වියදම් රු.113,671,287 ක් හා ප්‍රාග්ධන වියදම් රු. 4,777,448 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළදී ඉවත්කර තිබුණු වත්කම් අයිතම තුනකට අදාළ රු.2,709,244 ක ප්‍රත්‍යාගණන සංචිත ගිණුම්වලින් ඉවත් කළයුතු වුවද, රු.791,371 ක් පමණක් ගිණුම්වලින් ඉවත්කර තිබුණි. තවද වත්කම් ඉවත් කිරීමේ අලාභය රු.791,372 කින් අඩුවෙන් ගණනය කර ගිණුම් ගත කර තිබුණි.

(ඉ) ඉදිරි වර්ෂය වෙනුවෙන් ගෙවන ලද රු.386,015 ක වියදම්, සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙසත්, රු.1,355,169 ක ප්‍රාග්ධන වියදම් අයභාර වියදම් ලෙසත් ගිණුම්ගත කර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය තුළදී ගොඩනැගිලි ඉදිකිරීම් හා යන්ත්‍ර දෙකක් ස්ථාපනය කිරීම වෙනුවෙන් ගෙවා තිබුණු පිළිවෙලින් රු.5,499,124 ක හා රු.13,649,996 ක අත්තිකාරම් වලින්, සමාලෝචිත වර්ෂය තුළදී නිමකර තිබුණු වැඩ පිරිවැය හඳුනාගෙන කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ ගිණුමට මාරු කර නොතිබුණි.

(ඇ) ගිණුම්කරන වැරදි වල ස්වභාවය, අදාල වැරදි නිවැරදි කළයුතු වර්ෂයන් හා ඊට අදාළ අගය හඳුනා ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂයේදී ඉකුත් වර්ෂ ගැලපීම් ලෙස රු.27,868,284 ක් සමුච්චිත වියදම ඉක්මවූ ආදායමෙන් අඩුකර තිබුණි.

(ඈ) පුරෝකථනය කළ ඒකක බැර ක්‍රමය අනුගමනය කරමින් විශ්‍රාම පාරිතෝෂික ප්‍රතිලාභවල වර්තමාන වටිනාකම ගණනය කළයුතු වුවත්, ඒ වෙනුවට 2017 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම පාරිතෝෂික ප්‍රතිලාභ බැඳීම් වල අගය රු.42,956,779 ක් ලෙස 1983 අංක 12 දරන විශ්‍රාම පාරිතෝෂික පනතේ ප්‍රතිපාදන අනුව ගණනය කර ගිණුම්ගත කර තිබුණි.

(ඉ) ණයහිමියන් විසින් තහවුරු කරන ලද ණයහිමි ශේෂ හා ණයහිමි උපලේඛනයේ ශේෂ අතර වූ රු.7,776,374 ක වෙනසට හේතු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**තත්ත්වාගණනය කළ මතය**

තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින්, 2017 දෙසැම්බර් 31 දිනට සීමාසහිත ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) වගන්තිය ප්‍රකාරව මා විසින් පහත සඳහන් කරුණු දක්වමි.

(අ) මතය සඳහා පදනම හා විගණනයේ විෂය පථය හා සීමාකිරීම් ඉහත දක්වා ඇති පරිදි වේ.

(ආ) විගණනය සඳහා අවශ්‍ය සියළු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද බවත්, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා ඇති බවත්,

සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවයන්ට අනුකූල වන බවත් මා දරන්නා වූ මතය වේ.

**පාර්ලිමේන්තුවට වාර්තා කිරීම**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

**එච්.එම්.ගාමිණී විජේසිංහ**

**විගණකාධිපති**